# **2013 – 02 – 05** වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **1.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| **2.** | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **3.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **4.** | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **5.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **6.** | පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **7.** | ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **8.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **9.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

**(01)**

## 01:01 2013 – 01 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 01 – 08 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සංශෝධනයන්ට යටත්ව පිලිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 01 – 08 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>සංශෝධන 01</u>**

පිටු අංක 30 හි 8 වන ඡේදයේ ගරු නගර සභ මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින් යන්න ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා කතා කරමින් ලෙස නිවැරදි විය යුතුයි.

## 01:02 2013 – 01 – 28 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 01 – 28 දින පවත්වන ලද විශේෂ සභා රැස්වීම් වාර්තාව පිලිගත යුතු බවට ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 01 – 28 දින පවත්වන ලද විශේෂ සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** “ ණය පදනම මත ඉන්ධන නිකුත් කිරීම ” මැයෙන් සීමාසහිත අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරීතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අංක ගාදි/සමු/සං/02/18/ පොදු දරණ චක්‍රලේඛය අනුව රාජ්‍ය ආයතන සඳහා ණය පදනම මත ඉන්ධන නිකුත් කිරීමට නොහැකි අතර මාසිකව ගන්නා ඉන්ධන ප්‍රමාණයට සරිලන ඇප මුදලක් සමිතියේ තැන්පත් කල යුතු බවත් නැතහොත් අත්පිට මුදලට ඉන්ධන ලබා ගත යුතු බවත් දන්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, ඕක කලිනුත් තිබුණ. නගර සභාව කියන්නෙත් මහජනතාවට සේවය සලසන ආයතනයක්. චක්‍රලේඛනයක් තියෙනව වෙන්න පුළුවන්. නමුත් මේ වැඩ කටයුතු කරගෙන යද්දි අපි සල්ලි නොගෙවල නැනෙ. එහේට ලියුමක් ගහන්න අපි මෙච්චර කල් මෙතරම් ප්‍රමාණයක් අරගෙන තියෙනවා. ඇප තැන්පතු තියන්න අපිට අමාරුයි කලින් විදියටම අපට දෙන්න එහෙම නැත්තම් අපි වෙනත් ක්‍රම වේදයකට යනවා කියලා. සමුපකාර ෂෙඩ් එකට වඩා මෙහා ෂෙඩ් එකේ රු. 6 ක් විතර අඩුයි. අපි රජයේ ආයතනයකින් ගහන්න ඕන නිසයි එතනින් ගහන්නෙ. අපි මුදල් නොගෙව ඉඳල නැනෙ. ඔබතුමා සාකච්ඡා කරල තීරණයක් ගන්න.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, මේ චක්‍රලේඛනය නිකුත් කරේ 2010 මම හිතන්නෙ රාජ්‍ය ආයතන වලින් මුදල් නොගෙවීම සම්බන්ධව තිබෙන ගැටළුවක් නිසා. නමුත් අම්බලන්ගොඩ නගර සභාව කිසිම අවස්ථාවක මුදල් ගෙවීම පැහැර හැරල නෑ. ඒ චක්‍රලේඛනය ආවත් එවකට හිටිය සමුපකාර සභාපතිතුමා එක්ක සාකච්ඡා කරල අපට ඉන්ධන ලබා දුන්නා. අම්බලන්ගොඩ නගර සභාව කියන්නෙත් මේ නගරයේ ඉන්න පුරවැසියන්ට සේවය කරන ස්ථානයක්. ඒ නිසා සභපතිතුමනි අපි ඉල්ලා සිටිනවා ඔබතුමා කතා කරල බැරිනම් අපි රජයේ ආයතනයක් හැටියට තමයි සමුපකාර පිරවුම් හලෙන් ලබා ගන්නෙ. හැබැයි ලීටරයකට රු. 6 ක් වැඩියෙන් ගෙවල තමයි අපි ගන්නෙ. ඊට වඩා අඩු මුදලක් තමයි පෞද්ගලික ඉන්ධන පිරවුම්හලේ ගාන තියෙන්නෙ. මම හිතන්නෙ කිසි ප්‍රශ්නයක් වෙන එකක් නැහැ ඒ පිරවුම් හල අපිත් එක්ක පුද්ගලික සම්බන්ධතා තියෙනවා. ගරු සභාපතිතුමනි ඔබතුමා කතා කරල බලන්න අපිට ලොකු ලාභයක් ඇති වෙනවා. මම හිතන්නෙ අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුත් අකමැති වෙන එකක් නෑ. මොකද සමුපකාර සමිතිය ඒවගේ ක්‍රියාදාමයකට එනව නම් සභාවක් විදියට සභාපති තුමා ඇතුළු මන්ත්‍රීවරු අපි සියළු දෙනාම මුහුණ දෙන්නට ලෑස්තියි කියන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**පෙ. ව. 09.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**පෙ. ව. 09.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි චක්‍රලේඛනයක් නිකුත් කරල තියෙන අවස්ථාවේදී මෙය ගියවරත් ඉදිරිපත් වුනා කියල ඔබතුමා පැහැදිලි කරා. ඇත්තටම සමහර රාජ්‍ය ආයතන අතර තිබෙන මුදල් නොගෙවීමේ ප්‍රශ්න නිසා තමයි මෙවැනි තීරණයක් ගන්න ඇත්තෙ. අපි පුවත්පත් වල දැකල තියෙනව කෝටි ගණන් බිල් ගෙවන්නෙ නැතුව පත්තර වල වැටෙනව. ඒ හැමෝටම පොදුවේ ඉදිරිපත් කරපු චක්‍රලේඛණයක් අපටත් එවල තියෙනවා. අපිත් එක්ක හැමදාම විවිධ සේවා සමුපකාර සමිතිය කිසිම ගැටළුවක් නැතුව මුදල් ගෙවීමේදී යම් ප්‍රමාදයන් වෙනවා කොහොමත් ඒත් කිසිම ණයක් නැතුව හැමදාම මුදල් ගෙවල තියෙනවා. එදා චක්‍රලේඛනය නිකුත් කරපු අවධියෙත් එහෙම කරානම් අදත් කරන්න පුළුවන්. නමුත් මෙතුමා කිවූ පරිදි එහෙම රාජ්‍ය ආයතන වල තෙල් දෙන්නෙ නැත්තම් ස්ථාවර මිලක්නෙ තියෙන්නෙ ඒනිසා අපිට පුද්ගලික ආයතනයකින් ලබා ගන්න පුළුවන්. ඒ සඳහා අපේ කැමැත්ත අපි ප්‍රකාශ කරනවා. ඒක වරදක් නැහැ කියලයි මම හිතන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපේ සහෝදර ආයතනයකින් මෙවන් ලිපියක් මේ චක්‍රලේඛණයේ පිටපතක් එවීම සම්බන්ධව අපි කණගාටු වෙනවා. ඒ දේත් ඔවුන් වෙත යවන ලිපියට ඇතුලත් කරන්න කියල මම ඉල්ලා සිටිනවා. නගරයේ පවතින දැවෙන ප්‍රශ්නයක් පිළිබඳව ඔවුන්ට දිගින් දිගටම දැනුම් දීම සහ සහෝදරාත්මකව සාකච්ඡා කිරීම සම්බන්ධයෙන් මේ වැනි ස්වභාවයකට එතුමන්ලා එළඹෙනව නම් අපි අපේ තියෙන නගරයේ තියෙන අනන්‍යතාවය නගර වාසීන්ගෙ' සහ නගර සභාවේ ගරු සභාපතිතුමාගේ, මන්ත්‍රීවරුන්ගෙ අනන්‍යතාවය පිළිබඳ පැහැදිලි ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් ඒ

සම්බන්ධව කටයුතු කරමු කියන්නත් ඒ සම්බන්ධව දිගින් දිගටම අපට කෙනෙහිලි ස්වභාවයක් හා බොරු කාරණා ඉදිරිපත් කරමින් අපව නොමග යැවීමට උත්සාහ කිරීම සම්බන්ධව අපි නැවත වතාවක් කණගාටු වෙනවා. ගරු සභාපතිතුමනි එක පැත්තකින් අපි විශ්වාස කරනවා ලිඛිතව දැන්වීමක් අවශ්‍ය නොවන බවකුත් අපට වාසි සහගත තත්වයක් තුලදි අපට ඒ ශක්තිය සහ හැකියාව තිබෙන නිසා අපි සෘජු තීරණයක් අරගෙන මෙය ක්‍රියාත්මක කිරීමටම අපි එළඹෙමුයි කියන එක ගැන මම හිතනවා සහෝදර මන්ත්‍රීවරුත් ඒ අදහසේ ඉන්නවයි කියලා.

**පෙ. ව. 09.50 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

අපි සාමාන්‍යයෙන් මාසෙකට ලක්ෂ දෙකක විතර ඉන්ධන ගන්නවා. පසුගිය අවුරුද්ද වෙනකොට ලක්ෂ 24 ක විතර තෙල් අරගෙන තියෙනවා. මම හිතන්නෙ අපි හොඳ ගැනුම්කරුවෙක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපි ලක්ෂ දෙකක තෙල් ගහන කොට රු. 10000 ක 12000 ක ලාභයක් තියෙනවා වෙනත් පිරවුම්හලකින් ඉන්ධන ගත්තොත්. එතුමන්ලා ගැටුම්කාරී විදියට සහ අපිව නොමග යවන ආකාරයට උත්සාහ දැරීම සහ වක්‍රව අපට රිද්දවීම සම්බන්ධව අපි කණගාටු වෙනවා. ඔය පුංචි පොල ආශ්‍රිත ප්‍රශ්නයේදි සියළු දේශපාලන තීරණ අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සමස්ථ දේශපාලන වටපිටාවත් එක්ක අපට ඒ ආශීර්වාදයත් එක්ක කටයුතු මෙහෙයවීඹේ හැකියාව අපේ විපක්ෂයේ සහෝදර මන්ත්‍රීවරුත් අපිත් එක්ක ඉන්නවයි කියන විශ්වාසය පෙරදැරි කරගෙන අපි සෘජු තීරණයකට ඇවිල්ල ඒ අවශ්‍ය කටයුතු සියල්ලම පුංචි පොල ආශ්‍රිත ප්‍රශ්නය සහ ඉතිරි සියළු දේශපාලන තීරණ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සමස්ථ දේශපාලන වටපිටාව තුලම අපට ඒ කටයුතු මෙහෙයවීමේ හැකියාව සහ සියළුම මන්ත්‍රීවරුන් එකට ඉන්නවයි කියන විශ්වාසය පෙරදැරි කරගෙන අපි සෘජු තීරණයකට ඇවිල්ල අපි මේ මාස කිහිපය ඇතුලතදි අම්බලන්ගොඩ නගරය සැබෑ වෙනසකට ලක් කරමුයි කියල ඉල්ලා සිටිමන් මම නිහඩ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි, අපි ලක්ෂ දෙකක ඉන්ධන ගන්න කොට අපිට රු. 10000/- ක් විතර පාඩුයි. මෙහා එකෙන් ගත්තොත් ඒ රු. 10000/- ලාභය අපිට. ඒ අයට නැවත ලිපි අරින්න ඕන්නෑ. සභාපතිතුමනි මෙහා ඉන්ධන පිරවුම් හලෙන් ඔබතුමා කතා කරන්න. අපිට රු. 6/- ක ලාභයකුත් තියෙනවනේ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ලේකම්තුමා මේ සම්බන්ධයෙන් ලිඛිතව ඒ අයට දන්වන්න. අවශ්‍යතාවයක් වුන විටකදී ගෙවීම් කරල අඩුම ස්ථානයෙන් ලබා ගන්න ලේකම්තුමාට සහ ගණකාධිකාරීතුමාට බලය පවරනව.

තීරණය

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මීට පෙර ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් හිඟ මුදල් තබා නොමැති බැවින් ඉදිරියේදීත් මෙම සහනය ලබා දෙන ලෙස ඉල්ලීමක් කිරීමටත් එසේ ලබා නොදෙන්නේ නම් මිල අඩුම ස්ථානයෙන් ඉන්ධන ලබා ගැනීමට ලේකම්තුමාට සහ ගණකාධිකාරීතුමාට සභාවේ බලය පවරන ලදී.**

**3:2** " පැරණි ලිපිගොනු, වවුචර් හා කුවිතාන්සි පොත් විනාශ කිරීම සඳහා අනුමැතියට ඉදිරිපත් කිරීම " මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිගොනුව සභාගත කරන ලදී.

නගර සභා ලේඛනාගාරයේ අවුරුදු දහයකට වඩා පැරණි ලිපිගොනු, වවුචර් සහ කුවිතාන්සි පොත් විනාශ කල යුතු බව ඒ පිළිබඳව පත් කරන ලද කමිටුව විසින් තීරණය කර ඇති බවත් ඒ සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

තීරණය

☞ **ඉදිරිපත් කර ඇති ලිපිගොනු ලැයිස්තුවේ අංක දරන 18, 40, 90, 95, 109, 118, 121, 135, 130, 139, 168, 169, 173, 193, 194, 260, 261, 305, 404, 466 ලිපිගොනු හැර අනිකුත් ලිපිගොනු විනාශ කිරීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:3** " ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ වාර්ෂික සාමාජික මුදල පිළිබඳවයි " මැයෙන් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ජාතික සම්බන්ධීකාරකතුමිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය ශ්‍රී ලංකාවේ සියළුම පළාත් පාලන ආයතනයන් නියෝජය කරන ජාතික මට්ටමේ ආයතනයක් බවත් 2008 වසරේදී පිහිටුවන ලද මෙහි පළාත් පාලන ආයතන 335 ක් සඳහා පහසුකම් සලසන බවත් මෙමගින් පළාත් පාලන ආයතන සඳහා සේවාවන් රැසක් ඉටු කරනු ලබන බවත් සංගමයේ වාර්ෂික සාමාජික මුදල වන රු 10000/- ක මදුල ලැබීමට සලස්වන ලෙසත් ඉල්ලා තිබුණි.

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,

සභාපතිතුමනි මිට පෙර සංසදය මගින් දින පොතක් ලබා දුන්නා. ඒ දිනපොත ඉතා වැදගත් දිනපොතක්. සෑම නගර සභාවකම සභිකයන්ගේ විස්තර ඇතුලත්ව තිබුන මේ දින පොතේ. අපිට යම් දෙයකට සම්බන්ධ වීමේ අවස්ථාවකදි මේක වටිනවා. අපිට පළාත් සභාවෙන් එකක් එව්වත් අපි හැමදාම පාවිච්චි කරේ අර දින පොත. එය ලබා දෙන්න බැරිද කියන එක මම දැනගන්න කැමතියි.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,

හොඳ යෝජනාවක්. මේ යෝජනාව මේ අවුරුද්දට කරන්න බැහැ. ලබන අවුරුද්දට ක්‍රියාත්මක කරන්නම්. ඊට අමතරව මම උත්සාහ ගන්නම් ඔබතුමා කියපු දත්ත ටික වෙනම පොතක් මගින් ලබා දීමට කටයුතු කරන්නම්.

**<u>තීරණය</u>**

☞ **ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව වාර්ෂික සාමාජික මුදල වන රු. 10000/- ක් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය වෙත ගෙවීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**3:4** " විලේගොඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඇති හල්වතුර නිවාස යෝජනා ක්‍රමයට අළුතින් නමක් යෙදීම " මැයෙන් අම්බලන්ගොඩ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ විලේගොඩ (හල්වතුර) ශාඛාවේ සභාපතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ අංක 84 විලේගොඩ ග්‍රාම නිලධාරී වසමේ ඇති හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ දැනට භාවිතා කරන ප්‍රධාන මාර්ගය " විවෘත විශ්ව විද්‍යාල මාවත " ලෙස නම් කරන ලෙසත් අතුරු මාර්ග, 1 වෙනි පටුමග, 2 වෙනි පටුමග, 3 වෙනි පටුමග, 4 වෙනි පටුමග, 5 වෙනි පටුමග, 6 වෙනි පටුමග, 7 වෙනි පටුමග ලෙසත් නම් කරන ලෙස ඉල්ලා තිබුණි.

හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ දැනට භාවිතා කරන ප්‍රධාන මාර්ගය " විවෘත විශ්ව විද්‍යාල මාවත " ලෙස නම් කිරීම සුදුසු බවත් අතුරු මාර්ග, 1 වෙනි පටුමග, 2 වෙනි පටුමග, 3 වෙනි පටුමග, 4 වෙනි පටුමග, 5 වෙනි පටුමග, 6 වෙනි පටුමග, 7 වෙනි පටුමග ලෙස නම් කිරීම සුදුසු බවත් ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේ හරියට හල්වතුර යෝජනා ක්‍රමය කියල තමයි කියන්නෙ. ලිපි ලැබෙන්නෙත් ඒ විදියට. නමුත් මම දකිනදේ තමයි විවෘත විශ්ව විද්‍යාලය කිව්වම අද ලංකාව තුලම පිළගත් විශ්ව විද්‍යාලයක්. අපිට එක පැත්තකින් ආඩම්බරයක් තියෙනවා අපේ නගරයේ විවෘත විශ්ව විද්‍යාලයක් තිබීම ගැන. ලිපි එහා මෙහා ගනුදෙනු වෙන කොට අම්බලන්ගොඩ මේවගේ දෙයක් තියෙනවයි කියල අනිත් අය දැන ගන්නව. ඒ නිසා මම හිතනව නිවාස යෝජනා ක්‍රමය කියල දානවට වඩා එහි පදිංචි කරුවන්ටත් මේක ටිකක් ආඩම්බරයක් වේවි ඡන්ද නාමලේඛනයේ, හැඳුනුම්පතේ මේක ඇතුලත් කරගම. මම හිතනව අපි පුද්ගලයෙකුගේ නමක් දානවට වඩා විවෘත විශ්ව විද්‍යාල මාවත කියල දැම්මම අම්බලන්ගොඩ නගරයටත් පාරෙ පදිංචි අයටත් ඒකෙ වටිනාකමක් තියෙනවා. එම නිසා මේ සම්බන්ධයෙන් මාගේ පක්ෂපාතිත්වය දක්වමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

විලේගොඩ ශාඛා සමිතිය විසින් කරන ලද ඉල්ලීම පරිදි අද ඒ ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක් බවට පත් වෙලා. මේක අපි කිසි කෙනෙකුට ප්‍රශ්නයක් වෙලා නැහැ. ඒ මාර්ගයේ විවෘත විශ්ව විද්‍යාලය තියෙන නිසා මේක වඩා යෝග්‍ය වෙනවා. මෙය සිදු කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස මා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,

සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදී මහතුනි, නිලධාරීවරුනි, මේ මාවත විවෘත විශ්ව විද්‍යාල මාවත ලෙස නම් කරනව වගේම ඊට මෙහා පැත්තෙ තියෙන පාරටත් මේ නමම යොදනවද?

ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,

සභාපතිතුමනි ඡන්ද නාම ලේඛණයේ සඳහන් වෙලා තියෙන්නෙ කුලරත්න පාර කියල.

ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,

සභාපතිතුමනි මේ නමම එන්නෙ නෑ නේද?

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,

නැහැ.

ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,

සභාපතිතුමනි මේ නම් යෝජනා කරනව වගේම මහජනතාගේ අදහස් බලන්නත් ඕනෙ. එවගේම සභාපතිතුමනි පාරවල් නම් කරන පුනාම පුවරු වලත් පොඩි අඩුපාඩු තියෙනවා. එවත් නිවැරදි කරන්න. මේකට ලේඛනයක් පවත්වගෙන යන්න.

ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,

සභාපතිතුමනි මේ මාර්ග නම්කිරීම සම්බන්ධයෙන් අඩුපාඩු තියෙනවා. එව දන්වන්න කියල අපිට ලිපියකුත් ලැබුනා.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,

අළුතින් මාර්ග නම් කිරීමේ පුවරු සෑදීමේදී නගර සභා මුදල් කීයක්වත් වියදම් වෙලා නැහැ. සියල්ලම වෙළඳ අනුග්‍රාහක භවතෙක් මගින් තමයි කරගෙන තියෙන්නෙ. ඒ පුවරු ඒ අය අවුරුදු දෙකකට සැරයක් අළුත්වැඩියා කරනවා. බසු නැවතුම්පොලත් ඒ විදියට තමයි තියෙන්නෙ. අවුරුදු දෙකකට සැරයක් පින්තාරු කරනවා.

ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,

සභාපතිතුමනි ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන අතර ඒ සංශෝධන ඉදිරිපත් කිරීම සම්බන්ධව පටන් ගන්න අවස්ථාවෙම දැනුම්දීමක් කරා නම් වඩා හොඳයි.

ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,

මන්ත්‍රීතුමා මේ නම් ලබා දීම කරන්නෙ අදාල විෂය භාර නිලධාරියා විසින්. මම දෙනව නෙමෙයි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම එහෙම අදහසකින් නෙමෙයි කිව්වෙ. මන්ත්‍රීවරු දැනුවත් කිරීම මුල් අවස්ථාවෙදිම කරානම් හොඳයි කියල.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මන්ත්‍රීවරු දැනට තමන්ගෙ බල ප්‍රදේශයේ තියෙන අඩුපාඩු ඉදිරිපත් කරන්න. විශේෂයෙන්ම දෙමළ බසින් ලියපු එක නිවැරදිද බලන්න. මන්ත්‍රීවරු සහාය ලබා දෙන්න මේ මාර්ග ලැයිස්තුව නිවැරදි කර ගන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒ සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒවගේම සද්ධාසේන මාවතේ බෝඩ් එක සම්බන්ධයෙනුත් කටයුතු කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒවගේම ඔය ඉඩම් කැබලි කැන කොට ඒ නම් වලින් මාර්ග නම් කරන්න එපා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

එහෙම වෙන්නෙ නැහැ. අපි භාවිතා කරන්නෙ අපේ ලේඛනවල ඡන්දනාම ලේඛනයේ තියෙන නම් සහ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන පාරවල් තමයි. ඒක තමයි වලංගු.

**පෙ. ව. 10.10 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

<u>තීරණය</u>

**අංක 84, ග්‍රාම නිලධාරී වසමේ ඇති හල්වතුර නිවාස යෝජනා ක්‍රමයේ ප්‍රධාන මාර්ගය "විවෘත විශ්ව විද්‍යාල මාවත " ලෙස නම් කිරීම සුදුසු බවත් අතුරු මාර්ග 1 වෙනි පටුමග, 2 වෙනි පටුමග, 3 වෙනි පටුමග, 4 වෙනි පටුමග, 5 වෙනි පටුමග, 6 වෙනි පටුමග, 7 වෙනි පටුමග, ලෙස නම් කිරීම සුදුසු බවත් ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ     නැත

## (05) යථා පරිදි කල්දී ඇති යෝජනා

### 5:1 ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා

**5:1:1 ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජේ. වික්‍රමතිලක මහතා යන අය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.**

**“ අම්බලන්ගොඩ නගරයේ ඇති ජනප්‍රිය පාසල් සඳහා පළමු වසරට ළමුන් ඇතුලත් කිරීමේදී නගරයේ ළමුන් මෙම පාසල් සඳහා තේරී නොමැති තත්වයක් ඇතිවී තිබේ. මෙම ගැටළුව විසඳීම සඳහා නගර සභාව තුළින් එයට විසඳුමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු යැයි යෝජනා කර සිටිමි.”**

ඉහත සඳහන් යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මෙවන් යෝජනාවක් ගෙන ඒමට හේතු වුනේ මෙය සියළු දෙනාටම බලපාන ප්‍රශ්නයක් නිසයි. මොකද නගරයේ ජනප්‍රිය පාසැල් 04 ක් විතර තියෙනව තවත් පාසැල් කීපයක් තියෙනවා. නමුත් අම්බලන්ගොඩ නගරයේ තියෙන ජනප්‍රිය පාසලකට ළමයා දාගන්න තමයි දෙමාපියන්ගේ කැමැත්ත තියෙන්නෙ. නමුත් පහුගිය වසර වල ළමුන් ඇතුලත් කිරීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා ගියහම මේ චක්‍රලේඛණයේ තියෙන යම් යම් ගැටළු නිසා නගරයේ ළමයි ඇතුලත් නොකිරීම තමයි පෙනී යන්නෙ. එක පවුලක ළමයි 8 ක් හිටියොත් ඒ හැම දෙනාටම ඔප්පු නැහැ. සමහර වෙලාවට එක ගෙදරක දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්නවා. මේ ප්‍රශ්නෙදි මහජනතාව වැඩිපුරම ඇවිල්ල කියන්නෙ අපට. අපි ගිහිල්ල ඡන්දෙත් ඉල්ලන්නෙ ඒ මිනිස්සුන්ගෙන්. මේ නගරයේ පාලනය උදෙසා අපිව පත් කරල එවන්නෙත් ඒ අය. මේ ළමයි නොතේරීම සම්බන්ධව විශාල ප්‍රශ්න වලට අපට මැදිහත් වෙන්නට සිදු වුනා. අපි ගත්තොත් ධර්මාශෝක විද්‍යාලයට දැඩි තරගයක් තියෙනවා. ප්‍රජාපතියට අපි දන්නෙම නැහැ ළමයි ඇතුලත් කරල ඒ විදියට යනවා. නමුත් කුලරත්නෙට දැන් විශේෂ බලපෑමක් එනවා. අපේ හිටපු මන්ත්‍රීතුමා කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා නිසා අපට ලොකු පහසුවක් වෙලා තියෙනවා. පෝරඹ, පනියන්දුව, ඕකන්ද, කෙරමිණිය, පින්නදූව, තල්ගස්ගොඩ, පොල්වත්ත වගේ කොට්ඨාශ ගණනාවකින් ධර්මාශෝකයට නොතේරෙන ළමයි දේවානන්දෙට දැම්මත් තේරෙන්නෙ නෑ. කුලරත්නෙටත් චක්‍රලේඛණය අනුව නොතේරුනහම විදුහල්පතිතුමා කොහොමහරි කරල එතුමා අපේ නගරයේ ඉන්න මහත්මයෙක් හැටියට එතුමා මේ ප්‍රශ්න වලට මුහුණ දීල විශාල ගැටළු වලට පත් වුනා. නමුත් නීත්‍යානුල නොවුනත් ඒ ළමයි භාරගැනීමේ වගකීම අරගෙන තියෙනවා. නමුත් මේ දේවානන්ද විද්‍යාලය ගත්තහම කිසිම කෙනෙකුට තරගකාරිත්වයක් නැහැ. දේවානන්දෙ පංති 6 ක් විතර තියෙනවා. 40 ගානෙ බැලුවොත් 240 ක් වෙනවා. නගරයේ ළමයි ගැනීමක් අපට පේන්න නෑ. නමුත් අන්තිමට ළමයි පිරවෙන තත්වයක් අපට පේනවා. ඒ නිසා වඩා වැදගත් කුලරත්නෙ වගේම දේවානන්දෙත් මේ ගැන බලල විද්‍යාලයට ඇතුලත් කර ගැනීම වැදගත්. නගරයේ ළමයි සමසේ මේ පාසල් වලට බෙදෙන්න ඕනෙ. ධර්මාශෝක විද්‍යාලයට යම් ප්‍රශ්නයක් වුනොත් නඩු දාන්නම බලාගෙන තමයි මිනිස්සු ඉන්නෙ. අපි මන්ත්‍රීවරු හැටියට

මේක ලොකු ප්‍රශ්නයක් එනිසා මේ දේවානන්ද විද්‍යාලයට නගර සභාව මගින් අපි මැදිහත්වෙලා බලකිරීමක් නෙමෙයි මේක සාධාරණීකරණය කරල දෙන්න කියල තමයි අපි ඉල්ලන්නෙ. මොකද චක්‍රලේඛණය තුල ප්‍රශ්න තියෙනවා. කලින් තිබුන මීටර 300 ක් 500 ක් ඇතුලත අරගෙන ලකුණු කපන ක්‍රමවේදයක්. කෙසේ හෝ නගරයේ දරුව ඇතුලත් කරන ක්‍රමවේදයක් සැදිය යුතුයි. අපි මන්ත්‍රීවරු විදියට දන්නව මේ ළමය ඉන්නෙ මෙතනය ඉන්නෙ කියන එක. නමුත් ඒ ළමය නොතේරීම අපට හරි ප්‍රශ්නයක්. ඔබතුමා දැන් වසර ගණනක් සභාපතිධුරයේ හිටිය. ඔබතුමාට මේ අය ඇවිල්ල කිව්වම ඔබතුමාටත් හරි ප්‍රශ්නයක්. ඔබතුමා කතා කරත් ළමය ගැනෙන්නෑ. මේක පක්ෂ භේදයකින් තොරව අපේ වගකීමක්. නගරයේ ළමය නගරයේ ජනප්‍රිය පාසලට දැමීමේ ක්‍රමවේදයක් තිබිය යුතුයි. දේවානන්දෙට ඇතුලත් කිරීමේ හැකියාවක් තියෙනවා. සීමාවෙන් බාගයක් තියෙන්නෙ මුහුද. ජනප්‍රිය පාසලක් මෙතනත් තියෙනවා. නගරයේ ළමයි කොටසක් මෙතෙන්ටත් තේරෙනවා. යමක් කරන්න පුළුවන් ඇති හැකි කෙනා කොහොම හරි දා ගන්නවා. බැරි කෙනාගෙ අපේ නගරයේ දරුවන් ඇතුලත් කිරීම සඳහා ඔබ තුමා මැදිහත් වෙන්න. අපි ඕනම වෙලාවක ඔබතුමා එක්ක ඉන්නවා. අදාල සියළු අංශ දැනුවත් කරල මේකට විසඳුමක් ගන්න කියල මම ඉල්ලා සිටිනවා.

**පෙ. ව. 10.15 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ජයන්ත මන්ත්‍රීතුමා, දේවානන්ද විද්‍යාලයට ඇත්තටම නගරයෙ ළමයින්ට වඩා පිට ළමයි ගන්නවා. අපිට මොකක්හරි ක්‍රමවේදයක් කරන්න බැරිද නගරයේ ළමයි අරගෙන ඊට පසුව අනික් අය ගන්න විදියට.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

මමත් ඔබතුමාගෙ මතේ ඉන්නවා. හිරේවත්ත, මහ අම්බලන්ගොඩ, පනියන්දුව ප්‍රදේශ වල ළමයි ගැන මම විදුහල්පතිතුමාට පුද්ගලිකව ගිහිල්ල පෙන්නල තියෙනවා. පොඩි පොඩි අඩුපාඩු තියෙන අය එහෙම කියල මම ගොඩක් දාල තියෙනවා. මම කියන්නෙ මේ පොඩි අඩුපාඩු වලට ලකුණු කපන්න එපා. ඒ අය ගන්න ඕනෙ කියලා. මෙතනදී තියෙනවා ආසන්නතාවයට මෙච්චරයි පොරොත්තු ලේඛණයෙන් ගන්න පුළුවන්. ආදි ශිෂ්‍ය සංගමයෙන් මෙච්චරයි කියල. අභියාචනා මණ්ඩලය කරන්නෙ ඒව බලල තමයි ඒ ටික දාන්නෙ. ආදි ශිෂ්‍ය සංගමයෙන් තියෙනවා පොඩි දෙයක්. විදුහල්පතිතුමාට මේ අය ගන්න ඕනෙ කියල පොඩි ප්‍රෙෂර් එකක්. ආදි ශිෂ්‍ය සංගමයේ මම හිටියත් මම කියන්නෙ අම්බලන්ගොඩ ළමයි අරන් අනිත් අය ගන්න කියල. මම දැනුත් ඉන්නෙ ඒ ස්ථාවරේ. අනිත් එක දේශපාලන බලපෑම් එනවා. එතනත් තියෙනවා ප්‍රශ්නයක්.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ජයන්ත මන්ත්‍රීතුමා මේ පාර නීත්‍යානුකූල නාම ලේඛණයේ කෙරම්බිය, පින්නදුව, ඕකන්ද කොටසක්, තල්ගස්ගොඩ කොටසක් සම්පූර්ණම කුලරත්නෙටවත් නෑ. ඒ ළමයින්ට වෙන ඉස්කෝල එකක්වත් නෑ. ලොකු අසාධාරණයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි කන්දෙගොඩ ඉස්කෝලෙටත් ගහනවා සර්කල් එක. තව ඉස්කෝල ලග තියෙනව නම් ඒකටත් පහක් කැපෙනවා. එක පාරක් පාලමෙන් එහා පැත්තට කැපුව ධර්මාශෝකෙට ලකුණු. දේගොඩ ගෙදරකට කැපුව කුලරත්නෙට ලකුණු. ඊට එහා පැත්තෙ ගෙදරට කැපුවෙ නැහැ. ඒවගේ ප්‍රශ්න තියෙනවා. දැන් ධම්මකුසලෙට කපන්නෙ නැති නිසා ඒ පැත්ත බේරෙනවා. ඒත් මාදම්පෙට කපනවා. ඌරවත්තෙ ඉස්කෝලෙට කපනවා. අද පාසල් වල තත්වය මෙහෙම කතා කරන්න බෑ සභාපතිතුමනි. උදේට බලන්න ළමයි එන්නෙ කොහෙන්ද කියල නමුත් පේ ළමයින්ට තාම ඉස්කෝලයක් නෑ. මම විදුහල්පතිතුමාටත් කිව්ව නම්බිමුල්ල, හිරේවත්ත වගේ තැන්වල පදිංචි අය ගැන සොයල බලන්න කියල. ඔප්පුව නැතත් ඡන්දෙ තියෙනව නම් බලන්න කියල. ඊලගට ප්‍රජාපතියට කපනව ගැහැණු ළමයෙක් වුනොත්. එතකොට අපේ ළමයින්ට ලකුණු 9 ක් ඉවරයි. එතකොට දෙපැත්තෙන් එන අය එනවා. හිරේවත්තෙත් ඒක තියෙනවා. අර පැත්තෙ අයට ඔප්පු නැහැ සභාපතිතුමනි. ඒ අය ස්ථිර පදිංචි අය අවුරුදු ගානක්. මේ ලකුණු දීමේ ක්‍රමය තුල ඒගොල්ලො ලේසියෙන්ම කපා හරිනවා. ඒගොල්ලො සලකන්නෑ මේ අය මෙච්චර කාලයක් ඉඳල තියෙනවා. මේ දෙමව්පියො ඔප්පුව ලියපු නැති නිසයි ලකුණු අඩු වෙන්නෙ කියන එක. අපේ හිරේවත්තෙ මුහුදු තීරෙ ආණ්ඩුවෙන් ඔප්පු දීපු නැති තැන් තියෙනවා. ඒ අය සදා අනාථයි. ධර්මාශෝකෙටත් එහෙමයි දේවානන්දෙටත් එහෙමයි. ගෑනු ළමයෙක් වුනොත් ප්‍රජාපතියට රිංගවන්න පුළුවන්. මේවගේ දුර්වලකම් තියෙනවා. මට කිව්වොත් දෙයක් මම ඒ අයට උදව් කරනවා. එහෙම දේවල් තියෙනව නම් අපි කතා කරල මොනවහරි කරමු.  අම්බලන්ගොඩ ඉන්නෙ ළමයි 250 ක් 260 ක් නම් මේ අය අනිවාර්යෙන් මේ ඉස්කෝල වලින් එකකට යන්න ඕනෙ. මම දැක්ක බලපිටියෙ ප්‍රාදේශීය සභාවෙ ශ්‍රී. ල. නි. ප. මන්ත්‍රීවරයෙක් කියල තිබුණ අපේ මේ පාසල් වල ළමයි නැතුව පාසල් වැටෙන්නෙ මනාප ක්‍රමය තිබෙන නිසයි කියල අපේ පාසල් වල. ඊළග නගරයේ හොඳ පාසල් වලට ළමයි ඇතුලත් කරහම අපේ පාසල් හිස් වෙනවයි කියල තිබුණ. දැන් බලන්න තෙල්වත්තට ගිහිල්ල සුනාමියට හදල දීල තියෙනව හොඳ ඉස්කෝල. බඩු තියෙනවා. ළමයි සේරම මෙහේ. අම්බලන්ගොඩ අපට තමයි මේ සේරම බර ඇවිල්ල තියෙන්නෙ. අපට පාරක යන්න නෑ. කාටහරි අසාධාරණයක් වෙලා තියෙනව නම් මම එන්නම් ඕන වෙලාවක කතා කරන්න. මම ආදි ශිෂ්‍ය සංමයටත් කිව්ව අපේ ළමයින්ට තැන දීල අනිත් ළමයි ගන්න කියලා. ඒ තීරණේ තමයි මම ඉන්නෙ. ඔබතුමා කතා කරන්න යනව නම් මමත් එන්නම්. අපේ බදු ගෙවන්නන්ගෙ දරුවො දිහා බලන්න ඕනෙ අපි දේශපාලනේ නැතුව.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අම්බලන්ගොඩ නගරයේ වැසියන්ගෙ දරුවන් වෙනුවෙන් ගෙනා හොඳ යෝජනාවක් විදියටයි මා දකින්නෙ. අද බලනකොට ජනප්‍රිය පාසල හතරක් තියෙනවා අම්බලන්ගොඩ. ඊට අමතරව බුද්ධ දත්ත විද්‍යාලය. මේ විද්‍යාල පහෙන් එකකට අද අම්බලන්ගොඩ නගරයේ දරුවකුට ඇතුල් වෙන්න බැරි තත්වයක් උදා වෙලා තියෙනවා. විශේෂයෙන්ම තලගස්ගොඩ, පොල්වත්ත, පෝරඹ, කෙරම්ණිය, පින්නදූව ගත්තහම මේ ළමයි නගරයේ ඉන්න ළමයි. මේ නගරය තිබෙන්නෙ එක පැත්තකින් මුහුද අනික් දෙපැත්තෙන්ම වෙනත් ආසන දෙකක්. මෙහෙම තියෙද්දි මේ ළමයි ටිකට මේ පාසල් වලට ඇතුල් වෙන්න අවස්ථාව නැත්තම් මේ ළමයි කොහේටද යන්නෙ. විශේෂයෙන්ම දේවානන්ද විද්‍යාලයට ඇතුල් වෙන්න හිටිය ළමයි සුනාමි ව්‍යසනය නිසා ගියා තල්ගස්ගොඩ ප්‍රදේශයට. ගෙවල් 260 ක් තියෙන්නෙ එහේ. මේ දෙමව්පියන් හරිම අසරණ වෙලා ඉන්නෙ. ඒ ළමයි මෙහේ හිටිය නම් පාසලට උඩින්ම අහු වෙනවා. දැන් අහු වෙන්නෙ නෑ. හේතුව ඒ දෙමව්පියන්ට ඔප්පුව තාම ලැබිලා නෑ. හරිම අසාධාරණයි සභාපතිතුමනි මේක. වෙනත් නගර වලට හදන නීති මේ නගරයට හරියන්නෙ නෑ සභාපතිතුමනි. අපි කුලරත්න විද්‍යාලෙ විදුහල්පතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි දන්නවා ළමයෙක් පාසලට දාගන්න බැරි වුනොත් ඉස්සෙල්ලම දුවගෙන එන්නෙ අපි ළගට. ඒ දෙමව්පියො කියන්නෙ සාධාරණ හේතු. මේ ලකුණු ක්‍රමයට ගත්තම මුලින්ම අහුවෙන්නෙ දෙල්දූව. ඊලගට ගොඩහේන. ඒ ළමයි අහුවෙනවා. නගරයේ ළමයි අහුවෙන්නෙ නෑ. කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා මේ නගරයේ පුරවැසියෙක් වශයෙන් නගරයේ

දෙමව්පියන්ට සහනයක් ලබා දීල තියෙනවා. ඇයි අනික් විද්‍යාල වලට මේක කරන්න බැරි. මේ ව්‍යසනයක් හින්ද තල්ගස්ගොඩට ගිය ළමයා මෙතන හිටිය නම් දේවානන්දෙටත් අහු වෙනවා. ධර්මාශෝකෙටත් අහුවෙනවා. මම විශේෂයෙන් තල්ගස්ගොඩ, කෙරමිණිය පින්නදූව ගැන කතා කරන්නෙ. දේවානන්ද විද්‍යාලෙ පන්ති 6 ක් තියෙනවා. අද වෙනකොට ළමයි 18 යි 20 යි ඉන්නෙ. තව බාගෙට බාගයක් ඉඩ තියෙනවා. අපි කියන්නෙ කුලරත්නෙ විදුහල්පතිතුමාට සානුකම්පිතව බලල ළමයෙක් ඇතුලත් කර ගන්න පුළුවන්නම් ඇයි දේවානන්ද විද්‍යාලයේ ප්‍රජාපතී විද්‍යාලයේ එහෙම කරන්න බැරි. මේ චක්‍රලේඛය අනුව සුනාමි නිවාස වල හිමිකරුවා වශයෙන් ප්‍රාදේශීය ලේකම්තුමා තමයි බලධාරියා සභාපතිතුමනි. ප්‍රාදේශීය ලේකම්තුමා දීල තියෙනව නම් මේ නිවාසයේ හිමිකරු මේ පුද්ගලයා කියල ඒ ලියවිල්ල භාර ගන්නෙ නෑ සභාපතිතුමනි අද පාසලෙන්. ඒකට ලකුණු දෙන්නෙ නෑ. ඉතින් මොකක්ද තත්වෙ සභාපතිතුමනි. අද මහ අම්බලන්ගොඩ ළමයි, මානිමුල්ල ළමයි , පෝරඹ ළමයි, ඇතුල් වෙලා නැහැ දේවානන්දෙට. නගරෙ ළමයින්ට ඉස්කෝල නෑ. මේ නගරෙ තියෙන පාසල් වලට එන්නෙ පිට ළමයි. ජයන්ත මහත්මය කිව්ව වගේ අපට පාරට බහින්න බෑ උදේ වෙනකොට දවල් වෙනකොට. හැබැයි විදුහල්පතිවරුන්ට ගන්න ඕන ළමයි ගන්නව. කරුණාකරල සභාපතිතුමනි මේ ගැටළුව ගැන ඉතා ඉක්මනින් මේ ගැටළුව විසඳන්නට අමාත්‍යාංශෙට ගිහිල්ල ලේකම්තුමා හමුවෙලා හරි නැත්නම් මේක දන්වල යවන්න මේ ගැටළුව ළමයි ඇතුලත් කිරීමේදී. අපි මේක හැම අවුරුද්දෙම කතා කරනවා. ඒනිසා මෙය ඉතා ඉක්මනින් මේ නගර වැසියන්ගේ ළමයි වෙනුවෙන් අපි මැදිහත් වෙමු කියන ඉල්ලීම කරමින් අපි සියළු දෙනාම ඊට මැදිහත් වන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි අද දින ගරු රාහුල ලලිතවික්‍රම මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව කාලෝචිත යෝජනාවක්. අපි මේ සම්බන්ධව මිට පෙරත් සභා වාර දෙකකදි කතා කරල නැවත අමතක කරනවා. අම්බලන්ගොඩ නගරය අධ්‍යාපනය තෝතැන්නක් වෙච්ච සුවිශේෂී නගරයක්. අපිට කණගාටුවට කරුණ තමයි සභාපතිතුමනි මේ නගරයේ නගරවාසීන්ට අධ්‍යාපනය තුලින වන අසාධාරණය. මේ පළමු වසරට ළමුන් ඇතුලත් කිරීමේදී දිගින් දිගටම වන අසාධාරණය අධ්‍යාපන බලධාරීන්ට නොපෙනෙන එක කණගාටුවට කාරණයක්. අපි නගර වාසීන්ගෙ නියෝජිතයන් හැටියට එකරාශීවෙලා නගරයේ සිටින ඉදිරි පරම්පරාව වෙනුවෙන් නිශ්චිත පිළිතුරක් දීමට අපි පෙළඹෙන්න ඕන කියන එකයි සභාපතිතුමනි මගේ පෞද්ගලික හැඟීම. මෙහිදී මම මහ අම්බලන්ගොඩ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට කණගාටු වෙනවා මේ ප්‍රදේශය ආශ්‍රිත දරු දැරියන් බහුතරයක් දරුවන් මෙම කිසිඳු පාසලකට ඇතුලත් නොවීම සම්බන්ධව. එහිදී මම ප්‍රකාශ කරන්න ඕනෙ අපේ හිටපු මන්ත්‍රීතුමා ජගත් සේනාරත්න මහත්මය නොහිටින්න අපි ලොකු අපහසුතාවයකට පත් වෙනවා. එතුමා අපි මුහුණ පාන ප්‍රශ්න වලට ඇහුම්කන් දීල යම් සහනයක් සැලසෙන ආකාරයෙන් කටයුතු කිරීම සම්බන්ධව අපි එතුමාට ස්තුතිවන්ත වන අතර නිරන්තරයෙන්ම මේ ප්‍රශ්නය ගැන කොතනකදී වුනත් ධර්මාශෝකය ගැන තමයි අපි කතා වෙන්නෙ. එහිදී ගරු සභාපතිතුමනි අපිට කතා නොවෙන පාසලක් තමයි දේවානන්ද විද්‍යාලය. ධර්මාශෝක විද්‍යාලයේ යම් අසාධාරණයක් වුනොත් ඒ දෙමාපියන් නඩු මාර්ගයට යොමු වෙනවා. ඊට අවස්ථාවක් නොලැබෙන නගර වාසීන් දෙවන තේරීම හැටියට යොමුවෙන්නෙ කුලරත්න විද්‍යාලයට. අපේ සහෝදර විදුහල්පතිතුමා ජගත් සේනාරත්න මැතිතුමා ඊට ඌනපුරණයක් සපයමින් එතුමාට පුළුවන් වටපිටාවක් තුල විකල්පයක් යොදනව. මෙහිදී අප කණගායු වෙනවා අපේ සහෝදර විද්‍යාලයක් වන දේවානන්ද විද්‍යාලයට අපේ ගමේ දරු දැරියන්ට ඒ අවස්ථාව නොලැබීම සම්බන්ධව. මෙහිදී අපි කිසියම් කෙනෙකුට චෝදනා කරන්නෙ නැහැ. දෙවන පාර්ශවය වශයෙන් දේවානන්ද විද්‍යාලය තෝරා නොගැනීම සම්බන්ධයෙන් අපි යම් තාක් දුරකට දෙමාපියන්ගෙ පැත්තෙන් කණගාටු වෙනවා. අපේ විපක්ෂනායකතුමා කියූ පරිදි යොමු කිරීමක් කරොත් එහි ආදි ශිෂ්‍ය සංගමයට හෝ විදුහල්පතිතුමාට ඔවුන්ට පුළුවන් වටපිටාව තුලදී ඒ ළමුන් ඇතුලත් කර ගැනීමේ හැකියාවකට යොමු කිරීමට දෙමව්පියනුත් සිදු කල යුතුයි. එකම පාසලක් අල්ලගෙන ඉන්නෙ නැතුව. මෙහිදී සභාපතිතුමනි අපි අවධානයට ගත යුතුයි ලංකාවෙ පවතින

සංස්කෘතික තත්වය සහ සමාජීය තත්වයන් තුල සහ තිබෙන ආර්ථික තත්වයන් තුල මුදල් හදල් තියෙන පවුලක දෙමව්පියෙක් ඒ ඔප්පුව අදාල දරුවට පිරිනැමීමට දෙපාරක් හිතන්නෙ නැහැ. මෙහිදී මධ්‍යම පාන්තික සහ අඩු ආදායම්ලාභී අයට තමයි සැහෙන අසාධාරණය වෙන්නෙ. දරුවන් දෙන්නෙක් තුන්දෙනෙක් ඉන්න මධ්‍යම පාන්තික පවුලක ඉඩ කඩම් දෙක තුනක් අරන් දෙන්න බැහැ. ධීවර ප්‍රජාව වෙසෙන හිරේවත්ත, පටබැඳිමුල්ල, පල්ලියබඩවත්ත ප්‍රදේශ වලදි අපි තව දුරටත් මුහුණ පාන ගැටළුවක් තමයි එහි නිසි අයිතියක් පදිංචි කරුවන්ට නොමැතිකම. එහි අතුරු ප්‍රතිඵලයක් ලබල තියෙනවා තල්ගස්ගොඩ ප්‍රදේශයේ සුනාමි ගම්මානවල අළුතින් පදිංචි වෙච්ච අය මේ හා සමානව ගැටළු වලට මුහුණ පාල තියෙනවා. අම්බලන්ගොඩ සුවිශේෂී කාරණයක් තියෙනවා ධර්මාශෝක විද්‍යාලය මිශ්‍ර පාසලක් දේවානන්ද විද්‍යාලය මිශ්‍ර පාසලක් කුලරත්න විද්‍යාලය මිශ්‍ර පාසලක් ඒ තත්වයන් තුලදී සුවිශේෂ කාරණයක් වෙනවා. සංස්කෘතිය ජන වර්ගය සහ මිශ්‍ර පාසල් පදනම තුල ධීවර ප්‍රජාව පදනම තුල අඩු ආදායම්ලාභී ආර්ථික පදනම තුල ගරු අධ්‍යාපන අමාත්‍යතුමා, ලේකම් තුමා, අදාල අධ්‍යක්ෂකතුමන්ලා සමග සාකච්ඡාවකට යොමු වෙමු කියල ඉල්ලීමක් කරනවා. එහිදී මෙම කරණා සාකච්ඡාවට බඳුන් කරන්න කියල ඉල්ලා සිටිනවා. අපි එකමුතු වෙලා අම්බලන්ගොඩ නගරවාසීන්ට සාධාරණයක් ඉෂ්ඨ කරන්න අවශ්‍ය ඕනෑම කටයුත්තකට පෞද්ගලිකවත් මහජන නියෝජිතයෙකු හැටියටත් ඉදිරිපත් වෙනවා කියන තීරණය තුල අවශ්‍ය කටයුතු ඉක්මනින් කරමු කියල ඉල්ලා සිටිමින් නිහඩ වෙනවා. ස්තුතියි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**</u>

ගරු සභාපතිතුමනි අපිට සභාවෙ හැම අවුරුද්දෙම ඉදිරිපත් වන ප්‍රශ්නයක්. හැම අවුරුද්දෙම කතා කරනවා විසඳුමක් නැහැ. මේවට හේතු වන්නෙ චක්‍රලේඛනයේ තියෙන යම් යම් අඩුපාඩු. මේ ලකුණු දීම් තුල ඔප්පු වලට ලකුණු දෙනකොට ඔප්පුවක් නැති කෙනෙකුට මේ ලකුණු නැති වෙනවා. විශේෂයෙන්ම පොල්වත්තපුර තාම ඔප්පු නෑ. සමහර ගෙවල්වල පවුලේ හත් අට දෙනා ඉන්නව නම් අම්මට තාත්තට තමයි ඔප්පුව තියෙන්නෙ. උපන්දා පටන් ගමේ පදිංචි වෙලා ඉදල ගමේ හැදුනු වැඩුනු අයගේ දරුවො ඒ අයට ඒ ලකුණු ප්‍රමාණෙ නැති වෙනවා. අපි පාසල් යන කාලෙ මේවගේ ප්‍රශ්න තිබුනෙත් නැහැ. කතා කරෙත් නැහැ. අපි හැමෝම පාසලට ගියා. මේ මෑතක සිට මේ ජාතික පාසල් සංකල්පය තුල මේ ප්‍රශ්නෙ වැඩි වෙලා. මේක නගර වැසියන්ටත් තර්ජනයක්. අද පාසලක් ඇරුනු වෙලාවට ගාළු පාර විතරක් නෙමෙයි කුලරත්න මාවත පොල්වත්ත හංදිය දක්වා පාරවල්වල තදබදයක් ඇති වෙනවා. ඒකට හේතුව වෙලා තියෙන්නෙ පිට ප්‍රදේශ වලින් අම්බලන්ගොඩ නගරයට එකවර පිටවමත් එකවර ඇතුල්වීමත් නිසා. මේක පොලිසියටත් විශාල ප්‍රශ්නයක්. නගර සභාව හැටියට අපටත් ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නෙ කොච්චර කතා කරත් වැඩක් වෙන්නෙ නෑ. ඒ නිසා සභාපතිතුමා නගරයේ පළවෙනි පුරවැසියා විදියට ඔබතුමාත් මන්ත්‍රීවරුත් ප්‍රදේශයේ විදුහල්පතිවරු ගෙන්නල මේකට දිය යුතු විසඳුම පිළිබඳ සාකච්ඡාවක් කැඳවල ඉෂ්ඨ සිද්ධ කරොත් මීට වඩා යම් පහසුවක් ඇති වේවි ලබන අවුරුද්දටවත් මේ ප්‍රශ්නයට. කුලරත්න විද්‍යාලයේ ජගත් සේනාරත්න විදුහල්පතිතුමාට විදුහල්පතිවරයෙක් හැටියට නගරය ගැන හිතන්න හයියක් තියෙනව නම් අනික් විදුහල්පතිවරුන්ට ඒක නැති වෙන්න විදියක් නැහැ. මේ සම්මුඛ පරීක්ෂණ වලදි විදුහල්පතිවරුන්ට, තේරීම් කමිටුවේ ඉන්න අයට, පාසල් සංවර්ධන සමිතියේ නියෝජිතයන්ට විශාල තර්ජන. ගහගන්න මරාගන්න තරම් තත්වෙ මට්ටමට දෙමව්පියො සමහරක් යනවා. මේ දේවල් හැමදාම වෙනවට වඩා හොඳයි විදුහල්පතිවරුත් එක්ක නගරයේ ළමුන්ට වන අසාධාරණය සම්බන්ධව සාකච්ඡාවක් කැඳවල බලන අවුරුද්දෙවත් මේ ප්‍රශ්නය නොවෙන්න වගබලා ගන්න කියන ඉල්ලීම කරමින් මම නිහඩ වෙනවා ස්තුතියි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මාධ්‍යවේදීනි, නිලධාරීවරුනි, අපේ රාහුල මන්ත්‍රීතුමා ඉදිරිපත් කල යෝජනාව කාලෝචිත යෝජනාවක්. අපි හැමදාම වාද විවාද කරත් අපි අද වෙනකන් අත් කර ගත්ත ප්‍රතිඵල බොහොම අඩුයි. මේක නගරයේ වැසියන්ට බොහොම බරපතල විදියට දැනෙන ප්‍රශ්නයක්. ඒ නිසා මේ ප්‍රශ්නයට අවශ්‍ය විදියට ගොනු කරල විසඳුම් සොයා ගන්න අපහසු වෙලා තියෙනවා. අපි මේ ප්‍රශ්නෙ දිහා බලද්දි එක එල්ලේ තර්ක කරනවා මේ චක්‍රලේඛනය නිසා තමයි මේ ව්‍යසනය සම්පූර්ණයෙන් වෙලා තියෙන්නෙ කියලා. මේ ප්‍රශ්නෙ කොටස් දෙකක් තියෙනවා. එකක් තමයි අපේ නගරෙ ජනතාව මේ සම්බන්ධයෙන් දැනුවත් නොවිම සහ ස්වභාවයෙන්ම වෙන අඩුපාඩු. අනික් කොටස ජාතික වශයෙන් මේ චක්‍රලේඛනය පිලියෙල කිරීමේදී ඔවුන් පොදු නිර්ණායක විදියට භාවිතා කරන කොන්දේසි අම්බලන්ගොඩ වගේ නගරයකට එනකොට බරපතල විදියට ඒ නගර වැසියන්ට අසාධාරණයක් සිදු වේවි. මේ කරුණු දෙක තමයි අපි වෙන් වෙන් වශයෙන් සාකච්ජා කල යුත්තෙ. මා දන්නා කරුණු තුල අපි කතා කරොත් දෙමාපියන්ගෙ පැත්තෙන් අපට නිවැරදි කර ගන්න පුළුවන් කාරණා ගොඩක් තියෙනවා. අපි මන්ත්‍රීවරු කෑ ගහනවා. නමුත් අපි කවදාවත් බලල නෑ සෞඛ්‍යසේවා නිලධාරීන් යටතේ මේ නගරෙ සෑම අවුරුද්දකම බිහිවෙන දරුවන්ට සටහනක් ලැබෙනවා. මේක එක නිර්ණායකයක් වෙනවා ජාතික පාසලකට ඇතුලත් කර ගැනීමේදී. මේ සංඛ්‍යාලේඛන නිවැරදිව ගැනීමේ වගකීම අපිට තියෙනවා. ජනතාවට අවංකවම සේවය කරන්න අවශ්‍ය නම්. අපි දෙමවුපියන්ගෙ පැත්තෙන් නිවැරදි විය යුතු කාරණා මම මේ ඉදිරිපත් කරන්නෙ. මේකෙ පැතිකඩ දෙකක් තියෙනවා. අපි චක්‍රලේඛයටම ඇගිල්ල දික්කරොත් අපි ඉල්ලන සියළු දේවල් මොනම කමිටුවකටවත් ජාතික ප්‍රශ්නයකදි වෙනස් කරන්න බෑ. හැබැයි අපේ පැත්තෙන් තියෙන අඩුපාඩු හදා ගත්තොත් මේ ප්‍රශ්නෙට 50% ක විසඳුම් එනවා. මම වසර ගණනාවක් ඔය කමිටු වල ඉඳල අත්දැකීම් තියෙනවා. එකයි මම මේ දේවල් ඉදිරිපත් කරන්නෙ. මම අදහස් කර පරිදි සෞඛ්‍ය පෝෂණ සටහන පොත නීත්‍යානුකුල ලියවිල්ලක්. මේක දරුවන්ට ලැබෙන වරප්‍රසිදයක්. මොකද බලපිටියෙ ඉපදිච්ච දරුවෙක් මෙහේ ක්ලිනික් එකට එන්නෑ බෙහෙත් විදින්න. අපට තිබෙනවා නිශ්චිත කාල පරාසයක් තුල මේ අම්බලන්ගොඩ ප්‍රදේශයේ ඉපදිච්ච දරුවන් පිළිබඳ සංඛ්‍යාලේඛන. ඊළගට ග්‍රාමසේවක මහත්තයගේ සහතිකේ. මේක තමයි බරපතලම සහතිකේ. ලංකාවේ ඕනම අධිකරණයකදි අභියෝග කරන්න බෑ ග්‍රාමසේවක මහතා ඒ අය එතන පදිංචියි කියල ලබා දනෙ පදිංචිය පිළිබඳව සහතිකය. මැතිවරණ කොමසාරිස්තුමා මැතිවරණයකට පෙර අපට එවනවා ඡන්ද ලැයිස්තු ඡන්දෙ තියන අයගෙ නම් ගම් පදිංචි නැත්නම් දන්වන්න කියල. අපි ඒක කරන්නෙ නෑ. ග්‍රාමසේවක කවදාවත් මේ නම් කපන්නෙ නෑ. සමහර අය සහතිකය දීල නිර්නාමිකව කියනව මේ අය මෙතන පදිංචි නෑ කියල. ඒක ඊට වඩා බරපතලයි. එතකොට අමාරුවේ වැටෙන්නෙ සම්මුක පරීක්‍ෂණ මණ්ඩලයේ අය. දෙමව්පියො අතරෙ මේක ප්‍රචාරය ගියහම සම්මුක පරීක්‍ෂණ මණ්ඩලයෙන් නම දැම්මම කඩු පොලු අරන් එනව මෙච්චර ලියුම් දීල තියෙනව මෙච්චර කියල තියෙනව මේ අය මෙතන පදිංචි නෑ කියල ඒත් ළමයගෙ නම තියෙනවයි කියල. එහෙම දැම්මෙ නෑ ගිය අවුරුද්දෙ ළමයි 13 ක 14 ක ගෙ නම්. එක දෙමව්පියෙක් ගියා උසාවි. පදිංචිය ආඳදොල. දැනුත් පදිංචිය ආඳදොල. ප්‍රසිද්ධියේම එයා කිව්ව මම පදිංචිත් ආඳදොල කියල. බෝගහවත්තට ඇඩ්‍රිස් දැම්ම. අධිකරණ ක්‍ෂෙත්‍රයේ කෙනෙක්ගෙ දන්න කෙනෙක්ට මේක කියල නඩුව හැදුව. විදුහල්පතිතුමා බීල රෑ 11 ට බිරිඳට දොරට තට්ටු කරල ගෙදර ඉන්නවද කියල චෙක් කරල අයුතු බලපෑම් කරල අපහසුතාවයට පත්කරයි කියල. ලක්‍ෂ පහක් දඩ ගැහුව විදුහල්පතිතුමාට. ග්‍රාමසේවක සහතිකය දීල ඉවරයි මෙයා පදිංචියි කියල. ඒක කවුද ආරක්‍ෂා කරන්නෙ. ගමේ මිනිස්සු සැදී පැහැදිලා නැහැ ඒක ආරක්‍ෂා කරන්න. අයිතිවාසිකම් රැකගන්න නම් අපිත් ඉදිරිපත් වෙන්න ඕනෙ. අද ඒ ප්‍රශ්නෙ නිසාම විදුහල්පතිතුමා පාසල හැර යනවා. විදුහල්පතිවරු ඉන්නෙ නෑ මේවගෙ. ආසන්නතම හේතුව මේක. මේ ග්‍රාමසේවක සහතිකය දීම අපිට නිවැරදි කරන්න පුළුවන්නම් මොකද මේ ග්‍රාම සේවක සහතිකය මත අඩුම ළමයි 20 ක් 30 ක් මේ ජාතික පාසල්වලට පදිංචිය නැතුව ඇතුලත් වෙනවා පිට පළාත්වල අය. ඒ අය ඉතාම නිවැරදිව ඡන්ද ටික හදල තියෙනවා. ක්ලිනික් කාර්ඩ් එක හදල තියෙනවා. සියළුම ලිපි ලේඛන හරි. උදාහරණයක් විදියට මගේ ගෙදරට ලකුණු 100 ගන්න බෑ. ඒකට ලකුණු 100 තියෙනවා.

ඔක්කොම හදල තියෙන්නෙ. මේක නොගත්තොත් උසාවියෙන් අහනවා ලකුණු 100 ම තියෙනවා ලිපි ලේඛන නීත්‍යානුකූලයි ඇයි ගත්තෙ නැත්තෙ කියලා. භෞතිකව ගෙදරට ගියහම කියනවා අයුතු බලපෑම් කරන්න ආව කියලා. අපි ගෙදර හිටියා. ග්‍රාම සේවක සහතිකය දීල තියෙනව නම් කොහොමද පදිංචි නෑ කියන්නෙ. එහෙමයි කියන්නෙ. ග්‍රාමසේවක ගෙන්නල ඇහුවොත් උසාවියෙන් මෙයා මෙතන පදිංචිද කියලා. ග්‍රාමසේවක කියනවා ඔව් ස්වාමීනි මෙයා මෙතන පදිංචියි කියලා. එතනින් ඉවරයි. ඉතින් ඒ නිසා එතුමන්ලත් ආරක්ෂා වෙන විදියට පදිංචි අයට විතරක් සහතිකය ලබා ගන්න ඕන කම තියෙනවා. ඉතින් ඒව අපි ගමේ අය සංවිධානය වෙලා මන්ත්‍රීවරු එකතු වෙලා කරන්න ඕන දේවල්. ඊළඟට කසාද බදිනව අඩු වයසින්. ඡන්දෙ නෑනේ. එතකොට ළමයා එළියේ. අවුරුදු 16 න් 17 න් කසාද බැන්දම ඡන්දෙ නෑ. එවැනි කාරණා විසඳගන්න තියෙනවා. ඊළඟට ගරු සභාපතිතුමනි හිමිකම් ඔප්පු. ඔප්පු එක එල්ලේ හැමෝන්ටම නෑ. සහෝදරයගෙ නමට තිබුණොත් ලකුණු දෙන්නෙ නෑ. අම්ම තාත්තගෙ නමට තිබුණොත් ලකුණු අඩු වෙනවා. ඔප්පුවක් නැතිව බලහත්කාරෙන් පදිංචි වෙලා ඉන්නව නම් ඒත් ලකුණු නෑ. මේ කාරණා එක එල්ලෙ බැලුවට අවශ්‍ය වෙන්නෙ මේ අය ස්ථිර පදිංචිද කියල සනාථ කර ගැනීම. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය චක්‍රලේඛනය අනුව බලන්නෙ එක එල්ලෙ. මේ කාරණා අපිට තිබෙනවා අදාල නිලධාරීන් එක්ක කතා කරල මේව සරල කරල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට මේ බලය ලබා ගන්න චක්‍රලේඛනය ඇතුලෙ. හිමිකම් ඔප්පුව නම් ප්‍රාදේශීය ලේකම්තුමා. එතුමා දෙන ලිපිය වලංගු නැහැ මෙයාට මේ ඔප්පුව තියෙනවා මෙයාට මේක හිමියි කියල. ඔබතුමා නගරාධිපතිවරය වශයෙන් ඔබතුමා දෙන හිමිකම් කියයි කියන සහතිකය පිලිගන්නෙ නෑ. එකට හේතුව සම්මුඛ පරීක්ෂණයෙදි චක්‍රලේඛනයෙදි එක එක එල්ලේ නැහැ. මේවගෙ නීත්‍යානුකූල භාවයන් තේරුම් කරල දෙන්න තමයි අවශ්‍ය වෙන්නෙ. දෙමව්පියන්ට එක එල්ලේ ඔප්පුව ලියන්න බැහැ සභාපතිතුමනි. එක දරුවද ගෙදර ඉන්නෙ. දෙමව්පියන්ගෙ සෙවනෙ ඉන්නව නම් එතනදි ලකුණු 10 ම ලබා දෙන ක්‍රමයක් තියෙන්න ඕනෙ. මේ කාරණා වලදි මේ අයිතීන් නැති වෙන්නෙ ගමේ ළමයින්ට. මම මේ කතා කරන්නෙ ගමේ ළමයින්ට අයිතීන් නැති වෙන විදිය. මේව නිවැරදි කර ගන්න ඕනෙ. එහෙම නැතිව අපි කෑගහල වැඩක් නෑ සභාපතිතුමනි. මේ දේවල් එක්ක යන්න ඕනෙ. ඊළඟට අපි බෙදල ගත්තොත් ජාතික පාසලකට 40% ක් ගමේ ළමයි. ආරක්ෂක අමාත්‍යාංශයෙන් 30 ගානෙ එනවා. ළමයි 82 ක් විතර ගමේ ළමයින්ට එක එල්ලේම යන්න පුළුවන් ආසන්නතාවයෙන්. ධර්මාශෝකෙට හෝ දේවානන්දෙට. 15% ක් සහෝදර අනුග්‍රහය. මම මේ කියන කාරණා එක එල්ලේ නිවැරදි කර ගන්න පුළුවන්නම් අඩුම ගමේ ළමයි 130 ක් ගන්න පුළුවන් ආරක්ෂක අංශ හැර. දේවානන්දෙටත් අඩුම 130 ක් දාන්න පුළුවන් ගමේ ළමයි. කුලරත්නෙටත් එහෙමයි. මෙච්චර 390 ක් තිබ්ල අපිට මේක බෙදා ගන්න බැරි අපේ තියෙන දුර්වලකම් නිසා. මේව නිවැරදි කර ගන්න ඕනෙ සභාපතිතුමනි. ඊලගට සභාපතිතුමනි චක්‍රලේඛනය වෙනස් කිරීම පැත්ත ගැන අපි කතා කරොත් පළවෙනිම කාරණාව වෙන්නෙ අධ්‍යාපන අමාත්‍යාංශෙ නිලධාරීන් එක්ක කතා කරල මේ ඔප්පු වලට ලකුණු දෙන ක්‍රමය වෙනස් කර ගන්න. දෙමව්පියො යටතෙ ඉන්නව නම් අනිවාර්යෙන්ම ලකුණු 10 දෙන්න කියන්න පුළුවන්. හිමිකම් ඔප්පුව රජයේ නිලධාරීන් සහතික කරනව නම් ලකුණු 10 දෙන්න කියන්න පුළුවන්. ධර්මාශෝකෙයි දේවානන්දෙයි මිශ්‍ර පාසැල් නිසා ජාතික පාසලකට විතරක් ලකුණු කපන්න කියන එක යෝජනා කරන්න පුළුවන්. අම්බලන්ගොඩ දරුවෙක් කන්දෙගොඩ පාසලට යන්නෑනෙ සභාපතිතුමනි. මේක ප්‍රායෝගික නෑනෙ. ලංකාවෙම ගත්තොත් ඕකනෙ සංසිද්ධිය. ඒවගේ කාරණා මේ චක්‍රලේඛනය තුල වෙනස් කරන්නත් පුළුවන්. එහෙම නැත්තම් අම්බලන්ගොඩ නගරයට ගැලපෙන විදියට කමිටුවට බලය දෙන්න කියන්න. සමහර කාරණා වලදි අදාල කමිටුවට තියෙනවා බලයක් පවරන්න. ඒ බලය තුල මේ තීරණ ගැනීමේ ශක්තිය චක්‍රලේඛනය තුලින් දෙන්න කියන්න. මේ ප්‍රශ්නෙ ධර්මාශෝකෙට විතරයි බලපාන්නෙ. ඉතිහාසෙ කවදාක්වත් අම්බලන්ගොඩින් වෙන කිසිම පාසලකට නඩුවක් ගිහිල්ල නෑනෙ. මෙතන දෙමව්පියො අද වෙනකොට මරාගන්න තත්වෙට පත්වෙලා තියෙන්නෙ. ප්‍රසිද්ධියේම විදුහල්පතිවරයාට මරන තර්ජන කරන මට්ටමට ඇවිල්ල තියෙන්නෙ. ඒක නිසා මේක ප්‍රසිද්ධ ලේඛනයක්. ඒකෙත් අකටයුතු තියෙනවා. පදිංචි නැති අය ඉන්නවා. අර මම කියපු කාරණා වලින් ආපු අය. මේ පටබැඳිමුල්ලෙ ගිය සැරේ ලැයිස්තුවේ පොලිස් නිලධාරීන් පස් දෙනෙක් ඉන්නවා. ප්‍රසිද්ධියේම. ඒ අය අඩු වශයෙන් සුමානයකටවත් මෙතන පදිංචි නෑ. නමුත් ළමය

ඇතුලට ගියා නඩු තීන්දුව නිසා. ළමයි ඇතුලත් කිරීමේදී මේවට කෑ ගහල වැඩක් නෑ සභාපතිතුමනි. මේව අපි එකින් එක කතා කරල ජාතික පාසල් වල චක්‍රලේඛන හදන ඩිරෙක්ටර් හම්බ වෙලා එයත් එක්ක මේව සාකච්ඡා කරන්න ඕනෙ. එයාට බලය තියෙනවා චක්‍රලේඛනය වෙනස් කරන්න. මම මේ කියන්නෙ ගරු මන්ත්‍රීවරුන්ගෙ දැනගැනීම සඳහා. ඊලගට සභාපතිතුමනි වැඩියෙන්ම තියෙන ප්‍රශ්නය එකම ග්‍රාමසේවක වසම. කසාද බැන්දම වසම වෙනස් වෙනවා. එතකොට දරුවා එළියේ. මේව බොහොම සරල කාරණා. නමුත් අතෙන්ට බරපතලයි. ඉතින් මේ දේවල් එකතු කරන්න කමිටුවට බලය තියෙනවා. එකම ග්‍රාමසේවක වසම් තුල නම් ලකුණු එකතු කරල දෙන්න පුළුවන් ක්‍රමයක් හදන්න පුළුවන්. සමහර අවස්ථාවලදි එහෙම දුන්නා. මේව අපිට තියෙන ප්‍රශ්න. ඊලගට අහස් දුරයි. භෞතික දුරයි. අපි ගත්තොත් තුඩුවමුල්ල, මහ අම්බලන්ගොඩ, පනියන්දුව පළාතෙ දරුවෙක් කුලරත්නෙට යන්නෙ ගගෙන් නෙමෙයිනෙ. පයින්. මේව අපි සාකච්ඡා කරල භෞතික දුරට හදල මිනිස්සුන්ට සාධාරණය ඉෂ්ඨ කරන්න ඕනෙ. ඊලගට තියෙනවා එකම ඉඩමෙ ගෙවල් දෙක තුන. එතකොට එක දරුවටයි ඉස්කෝලෙට අයිතිය ලැබෙන්නෙ. ඉදිරියට 2014 හෝ වේවා අම්බලන්ගොඩ නගරයේ ජාතික පාසලකට ළමයි දාන්න ඉන්න දෙමව්පියො ටික ගෙන්නල තවත් මේ චක්‍රලේඛනය පිලිබඳ දැනුම තියෙන අයත් ගෙන්නල ඒ අයගෙ ෆයිල් ටික අපි හදල යවන එක තමයි කරන්න තියෙන එකම විසඳුම. අනික් පැත්තෙන් අධ්‍යාපන අමාත්‍යාංශෙට ගිහිල්ල ඒ චක්‍රලේඛනය සංශෝධනය කරන අධ්‍යක්ෂතුමා හම්බ වෙලා මේ පිලිබඳව විදුහල්පතිවරුන්ගෙනුත් අදහස් අරගෙන, කමිටුවල අයගෙනුත් අදහස් අරගෙන ප්‍රායෝගික තත්වයකට අපි යන්න ඕනෙ සභාපතිතුමනි මේ ප්‍රශ්නෙ විසදන්න නම්. නැත්නම් මේ ප්‍රශ්නෙ 2014 ටත් මේ විදියටම යනවා. මම කණගාටුවෙන් උනත් යම් දෙයක් කියන්න ඕනෙ. අපි පාසල් දෙකක් වහන්න අවසර දීල තියෙනවා. දේශපාලනඥයො වශයෙන් අමාරුම තීන්දු. නමුත් ගමේ දරුවන්ට ධර්මාශෝකෙ හිමිවේවා කියන ප්‍රාර්ථනය මත. අපේ පුද්ගලික ජීවිත වලටත් මේව ආදේශ කරල තිබුණ. විදුහල්පතිවරු බැනල තිබුණ. නමුත් අපි ඉතාම සත් භාවයෙන් මේව කරේ. හැබැයි මේ ළමයි තුන් හතර දෙනෙක් ඉන්න පාසලක් වැහීම තුල ඒ ගමේම ළමයින්ට ධර්මාශෝකයට ඇතුල්වීම හිමිවෙනවා. මෑතකදි අපි තීන්දුවක් ගත්තා ග්‍රාමිණීයෙ ප්‍රාථමික අංශය වහන්න. මේ ප්‍රශ්නෙ විසදගන්න අපි උත්සාහගමු කියල ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**පෙ. ව. 11.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරමිණියගේ මහතා සභා ගර්භයට පැමිණෙන ලදී.**

**පෙ. ව. 11.15 ට සභාව කාරක සභා අවස්ථාවක් බවට පත් කරන ලදී.**

**පෙ. ව. 12.10 ට කාරක සභා අවස්ථාව අවසන් කරන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි රාහුල මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් ඉතාමත් දීර්ඝ හා පැහැදිලි කරුණු රාශියක් අපේ සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරා. අපි ස්තුතිවන්ත වෙනවා කුලරත්න විදුහලේ විදුහල්පතිතුමාට තිබෙන ප්‍රායෝගික ගැටළු සම්බන්ධයෙන් අපිව දැනුවත් කරාට. ප්‍රදේශයේ සිටින මහජන නියෝජිතයන් වශයෙන් දෙමව්පියන් මුලින්ම එන්නෙ අපි ලගට. අපෙත් යුතුකමක් වගකීමක් වෙනව අපේ ගමේ දරුවන්ට අපේ ගමට අයිති පාසැල් වලට ඒ ළමයින්ට තියෙන අයිතිවාසිකමට අපිට තමයි දැඩි වගකීමක් තියෙන්නෙ. අපි සාකච්ඡා කරපු කරුණු අනුව ඉදිරි කටයුතු කිරීමේදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එකාවන්ව සහයෝගය දීල ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා හමුවෙලා චක්‍රලේඛනයේ තියෙන අඩුපාඩු සකසාගෙන කටයුතු කිරීමට අපේ යෝජනාව ලබා දීල ඒවගේම යම් හැකියාවක් තියෙනව

නම් කුලරත්න විද්‍යාලයේ විදුහල්පතිතුමා වගේම අනික් විද්‍යාලවල විදුහල්පතිවරුත් කැඳවල මේ සභාවෙදි සාකච්ඡා කර න්න පුළුවන් නම් ඒ සඳහා හොඳ ප්‍රවේශයක් අපට ලබා ගන්න පුළුවන්. එවගේම ජාතික පාසල් අධ්‍යක්ෂකතුමා සමග සාකච්ඡා කිරීමට ඔබතුමා දරන උත්සාහයට අපි සියළු දෙනාම සහයෝගය දෙනවා. අපේ විපක්ෂ කණ්ඩායමේ සහයෝගය මේ සඳහා ලබා දෙන බව පවසමින් මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ඉක්මනින්ම අවස්ථාව උදාකරගනිමුයි කියා පවසමින් මම නිහඩ වෙනවා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

රාහුල ලලිතවික්‍රම මැතිතුමා ප්‍රමුඛ මන්ත්‍රීවරුන් හත් දෙනෙක් අත්සන් කරල ගෙනා මෙම යෝජනාව ඇත්තවශයෙන්ම ලංකාවේ නගර සභා ප්‍රාදේශීය සභා මහ නගර සභා ගත්තොත් මේ පාසැල් සම්බන්ධව වැඩිපුරම සාකච්ඡා කරන ආයතනය මම හිතන්නෙ අම්බලන්ගොඩ නගර සභාව වෙන්න පුළුවන්. අම්බලන්ගොඩ නගරය වැදගත් වීමට ප්‍රධානතම හේතුව වන්නේ අධ්‍යාපනයයි. බුද්ධිමතුන්ගේ නගරය කියල හැඳින්වෙන අම්බලන්ගොඩ නගරය දැනුම වර්ධනය කර ගැනීම නිසා එන පිරිස් නිසා ඇත්තටම අද වෙනකොට සාමාජීය ප්‍රශ්නත් ගොඩනැගිල තියෙනවා. මෙහිදී අපේ ඡන්ද දායකයන් අපේ වරිපනම්ලාභීන් සුරැකීම අපේ පරම යුතුකමක් ලෙස සලකන නිසා මෙහිදී අපි ජනතාව වෙනුවෙන් කල යුතු සමහර කාරණා අපි කාරක සභා අවස්ථාවට පත් කරල පක්ෂ විපක්ෂ භේදයකින් තොරව එකගතාවයකට පත්වීමට හැකිවීම මම හිතන්නෙ සන්තෝෂයට කරුණක්. මෙහිදී අපි පක්ෂ වශයෙන් බෙදී වෙන්වෙලා හිටියත් අපි එකම නගරයේ එකම ගමේ උපන් අය. අපි අතර තියෙන්නෙ ඡන්ද කාලයේදි තියෙන වෙනස්කම් පමණයි. අපි අතර තියෙන එකම පරමාර්ථය ප්‍රදේශයේ ජනතාවට සේවය කිරීම. එහිදී තියෙන අවහිර බාධා ඉවත් කර ගැනීමට පියවර රාශියක් අපි අද දින කතා කරනු ලැබුවා. එවගේම එය ප්‍රායෝගික තලයට ගෙන ඒම සඳහා ගත යුතු පියවර ක්‍රමයෙන් ගැනීමට අපට සිදු වෙනවා. සමහර ප්‍රශ්න වලට පිලිතුරු සැපයීමේදී දුෂ්කර අවධි පසු කරන්නට සිදු වෙනවා. මේ අවස්ථාවෙදි අපි අම්බලන්ගොඩ පුරවැසියන් විදියට අපේ වැසියන්ගේ අයිතීන් සුරැකීම සඳහා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි 12 දෙනාම අත්වැල් බැඳගෙන එකට මේ ගමන ගිහිල්ල අපේ පුරවැසියන්ට සාධාරණත්වය ඉටු කිරීම සඳහා කටයුතු කිරීම වඩා යෝග්‍යයි. අපේ නගරය තුල ළමයි 17000 ක් විතර අධ්‍යාපනය ලබනවා. මෙහිදී අපට කියන්න බැහැ පාරවල් වල ඉඩ මදියි. කට්ටිය පිටින් එනව වැඩියි කියලා. මේ නගරයේ තියෙන ජනප්‍රියතාවය නිසා තමයි මෙවැනි තත්වයන්ට අපිට මුහුණ දෙන්න සිදු වෙන්නෙ. විශාල වශයෙන් නගරයට වාහන එනව නම් අපිට එන්න එපයි කියන්න බැහැ. අපේ යුතුකම වාහන නවත්වන ස්ථානයක් හදන එක. අපි අළුත් නීති රීති පවා හඳුන්වා දුන්නා මේ මාර්ග ප්‍රශ්නය උඩ. ජනප්‍රිය පාසල් කිහිපයක් අපේ නගරය තුල පිහිටා තිබීම තමයි අපේ ආඩම්බරය. එය රැකගැනීම සඳහා අපිට කල හැකි සියල්ල කිරීමට අපි එකතු වෙමු එවගේම රාජ්‍ය චක්‍රලේඛන පැත්තෙන් තියෙන අඩුපාඩු සකස් කර ගැනීමට අදාල නිලධාරීන් එක්ක සාකච්ඡා කරල අපිට කරන්න පුළුවන් උපරිම ශක්තිය දරමුයි කියල ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

මෙම යෝජනාව සම්බන්ධයෙන් පක්ෂ විපක්ෂ සියළු මන්ත්‍රීවරුන් සහයෝගය දීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා ස්තුතියි.

**තීරණය**

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව අම්බලන්ගොඩ නගර වාසීන්ගේ අයිතීන් සුරැකීම සඳහා ගත යුතු පියවර ගැනීමටත් රාජ්‍ය චක්‍රලේඛන වල සිදු කල යුතු වෙනස්කම් සම්බන්ධයෙන් ජාතික පාසල් අධ්‍යක්ෂතුමා සමග සාකච්ඡා කිරීමටත් තීරණය කරන ලදී.**

**ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**5:1:2 " ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ අංක 1780/20 අනුව ගමන් වියදම් සම්බන්ධයෙන් ගෙවීම් කිරීමේදී, සභාවේ සිදුවන පරිපාලන හා සංවර්ධන කටයුතු අධීක්ෂණය කිරීම සඳහා උප සභාපතිවරයා ඇතුළු සියළුම නාගරික මන්ත්‍රීවරුන්ට බලය පැවරිය යුතු යැයි යෝජනා කර සිටිමි."**

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**5:2 නිලධාරීන් විසින් ඉදිරිපත් කරන පරිපාලන යෝජනා**

**5:2:1 ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව.**

**" නොමිලේ අභ්‍යාස පොත් බෙදාදීම වෙනුවෙන් දරණ ලද රු. 1,227,448.00 ක මුදල සඳහා ගරු සභාවේ අනුමැතිය ලබා දීමට යෝජනා කර සිටිමි."**

අම්බලන්ගොඩ නගර සභාව මගින් බල ප්‍රදේශයේ පදිංචි පාසල් දරු දැරියන් 1849 ක් සහ නගර සභාවේ සේවයේ නියුතු නිලධාරී, සේවක මහත්ම මහත්මීන්ගේ දරු දැරියන් 154 වෙනුවෙන් 2013 අධ්‍යයන වර්ෂයට අදාළව අභ්‍යාස පොත් ලබා දීමේ උත්සවය වෙනුවෙන් දරණ ලද සත්‍ය වියදම පහත සඳහන් පරිදි වන බවත් මෙම වියදම් දැරීම සම්බන්ධයෙන් ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන බවත් දන්වා තිබුණි.

| | | |
|---|---|---|
| පොත් සහ ලිපි ද්‍රව්‍ය සඳහා වියදම | - | රු. 1070915.00 |
| වේදිකාව මඩුව හා පුටු සඳහා | - | රු. 90000.00 |
| ශබ්ද විකාශන පහසුකම් සඳහා | - | රු. 25250.00 |
| ඡායාරූප ඇල්බමය සඳහා | - | රු. 8610.00 |
| සැරසිලි, සංග්‍රහ ප්‍රවාහන හා අතිරේඛ වියදම් | - | රු. 32673.00 |
| | | රු. 1227448.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධයෙන් ඡන්දය විමසනු ලදුව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා, ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා, ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා, ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා, ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා, ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා, ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා යන අය පක්ෂව ඡන්දය ප්‍රකාශ කර අතර විපක්ෂව එක් ඡන්දයක්වත් ප්‍රකාශ නොවන ලදී. ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා ඡන්දය දීමෙන් වැලකී සිටින ලදී,

**ඒ අනුව වැඩි ඡන්ද 8 කින් මෙම යෝජනාව සභා සම්මත විය.**

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 01- 07** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013-01- 074 දින පවත්වන ලද කළමනාකරණ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 01- 22** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013-01- 22 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 01- 24** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලබන ක්‍රියාකාරී කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -01- 24 දින පවත්වන ලද අම්බලන්ගොඩ නගර සභාව සහ වෙළඳ සංගමය ඒකාබද්ධව පවත්වනු ලැබූ ක්‍රියාකාරී කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 4** **2013- 01- 23** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -01- 23 දින පවත්වන ලද ක්‍රීඩා කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 5** **2013- 01- 17** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරමිණියගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -01- 17 දින පවත්වන ලද සෞඛ්‍ය හා සනීපාරක්‍ෂක කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

<u>ටෙන්ඩර්</u> :-

**7:1:1** අම්බලන්ගොඩ තානායම් භූමිය මැන බෙදා වෙන්කිරීමට අදාලව මිල ගණන් කැඳවන ලද අතර එක් මිල ගණනක් පමණක් ඉදිරිපත් වී තිබු බැවින් එම මුදල වන රු. 18500/- ක මුදල සහිත එම ටෙන්ඩරය පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ටෙන්ඩර්කරුගේ නම | ලිපිනය | මුදල රු. | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| 01 | ජේ. පී. නිහාල් එම්. ද සිල්වා | 286/6, මහා වීදිය අම්බලන්ගොඩ | 18500/- | - |
| | | | | |

**7:2** <u>මිල ගණන්</u> :-

**7:2:1** ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | සක්වා ප්‍රින්ටර්ස් | ඕ ආර් එස් ප්‍රින්ටර්ස් | ආරියදාස ප්‍රින්ටර්ස් |
|---|---|---|---|---|---|
| 01 | පරිසර ආරක්‍ෂණ බලපත්‍ර | 50 | **77.50** | 85.00 | 105.00 |
| 02 | පොත් තුණ්ඩු | 5000 | **.75** | 1.50 | 1.25 |
| 03 | දින පත්‍රිකා | 5000 | **1.15** | 1.75 | 1.40 |
| 04 | පොත් සාක්කු | 5000 | **3.75** | 6.25 | 4.90 |

**7:2:2** විදුලි උපාංග සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත සලකුණු කර ඇති මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ඩෙල්ටා ඉම්පෙක්ස් | ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් | සෙන්ට්‍රල් ඉලෙක්ට්‍රොනික්ස් |
|---|---|---|---|---|---|
| 01 | 1/044 වයර (100m) රෝල් | 05 | 1650/- | **1600/-** | 1650/- |
| 02 | 13 Amp ප්ලග් (Orange) | 20 | 385/- | **375/-** | 385/- |
| 03 | 5 Amp ප්ලග් (Orange) | 20 | 360/- | **350/-** | 355/- |
| 04 | මර්කරි බල්බ් (125W) | 100 | 410/- | **390/-** | 400/- |
| 05 | ඔටෝ ස්විච් | 05 | 850/- | **650/-**<br>950/- | 700/- |
| 06 | ආම් (ලැම්ප් ෂේඩ්) | 50 | 300/- | **275/-** | 285/- |
| 07 | ෂේඩ් | 50 | 300/- | **275/-** | 285/- |
| 08 | වෝල් ෆෑන් | 02 | 4750/- | **4500/-** | 4600/- |

**7:2:3** විදුලි උපාංග සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | ගම්පහ ඉලෙක්ට්‍රිකල්ස් | බී කේ එස් කම්පැනි | ජෙනරල් ස්ටෝර්ස් |
|---|---|---|---|---|---|
| 01 | Wall Fan | 02 | 4500/- | 6480/- | 4400/- |
| 02 | Electric Heater | 01 | 500/- | 450/- | 475/- |
| 03 | Cassette Recorder | 01 | 2950/- | - | - |

**7:2:4** පොත් බැඳීමේ උපකරණ සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | රෝයල් බුක් ෂොප් | චාමර ඉන්ඩස්ට්‍රිස් | ඒ. කේ. අයි. ටී. ගුණතිලක |
|---|---|---|---|---|---|
| 01 | චිප් බෝඩ් 78cm X 65cm | 250 | 32/- | 23/- | 26/- |
| 02 | බ්‍රෝවින් පේපර 90cm X 60cm | 500 | 13/- | 10/- | 15/- |
| 03 | පෑඩ් ඉන්ක් | 10 | 100/- | 70/- | 80/- |
| 04 | බොක්ස් ෆයිල් | 25 | 190/- | 275/- | - |

**7:2:5** දැව ඉරීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරී නිර්දේශය මත ලැබී ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | වයි. නිහාල් | කේ. චන්ද්‍රතිලක | ආර්. එම්. ජයසිර |
|---|---|---|---|---|---|
| 01 | 4” X 3” ලී | | 60/- | 60/- | **55/-** |
| 02 | 4” X 2” ලී | | 45/- | 40/- | **30/-** |
| 03 | 2” X 2” ලී | | 15/- | 18/- | **13/-** |
| 04 | 2” X 1” ලී | | 10/- | 9/- | **7/-** |
| 05 | 1 1/8 ” ලෑලි | | 70/- | 75/- | **62/-** |
| 06 | 1” ලෑලි | | 60/- | 60/- | **55/-** |

**(08)** ගෙවීම්

8. 1 ඇ. අංක 534 යටතේ ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා ගෙන්වන ලද රන්, රිදී, ලෝකඩ පදක්කම් වෙනුවෙන් අම්බලන්ගොඩ, කුලරත්න පාර, සමාරා ප්ලාස්ටික් සහ ග්‍රැෆික්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 18720/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| රන් පදක්කම් | 39 X 160 | = | 6240.00 |
| රිදී පදක්කම් | 39 X 160 | = | 6240.00 |
| ලෝකඩ පදක්කම් | 39 X 160 | = | 6240.00 |
| | | | 18720.00 |

8.2 ඇ. අංක 0408 යටතේ ත්‍රිරෝද රථ බලපත්‍ර ස්ටිකර් සැකසීම වෙනුවෙන් ඇන්ටිස් ග්‍රැෆික්ස් සිස්ටම්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 39750/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ත්‍රිරෝද රථ බලපත්‍ර ස්ටිකර් කට්ටල | 42.50 X 300 | - | 12750.00 |
| ත්‍රිරෝද රථ පසුපස ස්ටිකර් කට්ටල | 90/- X 300 | - | 27000.00 |
| | | | 39750.00 |

8.3 ඇ. අංක 343 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පහත සඳහන් ගල් වෙනුවෙන් දයාරත්න එන්ටර්ප්‍රයිසස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 22800/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| Chips Cube | = | 5500 X 2 | = | 11000.00 |
| 1 ½ Metal | = | 4500 X 1 | = | 4500.00 |
| 6” X 9” Metal | = | 2800 X 1 | = | 2800.00 |
| ¾ Metal | = | 4500 X 1 | = | 4500.00 |
| | | | | 22800.00 |

8. 4 ඇ. අංක 0404 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද සිමෙන්ති වෙනුවෙන් බී. කේ. එස්. කම්පැනි වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 27900/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.5 ඇ. අංක 0382 යටතේ නගර ක්‍රීඩා උළෙල සඳහා ලබා ගන්නා ලද පහත සඳහන් ද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 60875/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ෆයිල් කවර | 28.50 X 650 | - | 18525.00 |
| සමරු කලාප | 38.00 X 650 | - | 24700.00 |
| පෝස්ටර | 41.00 X 350 | - | 14350.00 |
| ආරාධනා පත්‍ර | 22.00 X 150 | - | 3300.00 |
| | | | 60875.00 |

8.6 ඇ. අංක 0390 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද තම්බපු හුණු වෙනුවෙන් අම්බලන්ගොඩ, පොල්වත්ත, පූර්ණ හාඩ්වෙයාර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.7 ඇ. අංක 381, 392, 396, 398 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, පොල්වත්ත, පූර්ණ හාඩ්වෙයාර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57210/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | | |
|---|---|---|---|---|
| Enamel paint (04L) | = | 3090 X 2 | = | 6180.00 |
| Enamel paint (04L) | = | 3090 X 2 | = | 6180.00 |
| Emulsion paint (10L) | = | 6565 X 3 | = | 19695.00 |
| Floor paint (04L) | = | 2980 X 1 | = | 2980.00 |
| Floor paint (1L) | = | 835 X 2 | = | 1670.00 |
| Amary papers | = | 15 X 10 | = | 150.00 |
| Amary papers | = | 15 X 10 | = | 150.00 |
| Emulsion paint (10L) | = | 5860 X 3 | = | 17580.00 |
| Bricks | = | 10.50X250 | = | 2625.00 |
| | | | | 57210.00 |

8.8 ඇ. අංක 391, 394 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පහත සඳහන් ද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, පොල්වත්ත, පූර්ණ හාඩ්වෙයාර් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 75905/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Emulsion Paint (10L) | 3 X 5860/- | - | 17580.00 |
| Emulsion Paint (01L) | 2 X 690/- | - | 1380.00 |
| Emulsion Paint (04L) | 3 X 2455/- | - | 7365.00 |
| Emulsion Paint (20L) | 2 X 16240/- | - | 32480.00 |
| Wall Potty (04L) | 2 X 625/- | - | 1250.00 |
| Thinner (01L) | 16 X 210/- | - | 3360.00 |
| Floor Paints (04L) | 03 X 2980/- | - | 8940.00 |
| Paint brush 5” | 02 X 800/- | - | 1600.00 |
| Paint brush 1” | 02 X 175/- | - | 350.00 |
| Paint brush 5” | 02 X 800/- | - | 1600.00 |
| | | | 75905.00 |

8.9 ඇ. අංක 0347 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ඇඟිලි සලකුණු යන්ත්‍රය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි රාජ්‍ය වානිජ්‍ය නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 79240/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.10 ඇ. අංක 298, 343 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද පහත ද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, තිලකපුර දයාරත්න එන්ටර්ප්‍රයිසස් වෙත රු. 14800/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.11 ඇ. අංක 0369 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගම් බූට්ස් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, රාජපක්ෂ ස්ටෝර්ස්හි ආර්. එම්. නිශාන්ත මහතා වෙත රු. 12000/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.12 ඇ. අංක 0401 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගෑස් වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. පී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.13 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10948.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3563 | ඩීසල් | 42 |
| | Engine Oil | 02 |
| 3577 | ඩීසල් | 42 |

8.14 නගර සභාව සතු 49-9436 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12594.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3551 | ඩීසල් | 40 |
| 3561 | ඩීසල් | 24 |
| 3576 | ඩීසල් | 40 |

8.15 නගර සභාව සතු 49-9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12281.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3560 | ඩීසල් | 48 |
| | Engine Oil | 02 |
| 3572 | ඩීසල් | 44 |

8.16 නගර සභාව සතු 49-9421 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12352.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3552 | ඩීසල් | 40 |
| 3553 | ඩීසල් | 23 |
| 3575 | ඩීසල් | 39 |

8.17 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 18415.30 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3562 | ඩීසල් | 135 |
| | Engine Oil | 05 |

8.18 නගර සභාව සතු RA-2509 අංක දරණ ගලි බවුසරය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15200.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3556 | ඩීසල් | 52 |
| | 68HD හයිඩ්‍රොලික් ඔයිල් | 05 |
| | බ්‍රේක් ඔයිල් | 1/2 |

8.19 නගර සභාව සතු LF-1853 අංක දරණ ටිපර් රථය සඳහා 2012 දෙසැම්බර් මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17367.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3567 | ඩීසල් | 71 |
| | Engine Oil | 02 |
| 3573 | ඩීසල් | 63 |

8.20 නගර සභාව සතු 49- 9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2012 දෙසැම්බර් මස 15-30 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 11771.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3585 | ඩීසල් | 42 |
| 3701 | ඩීසල් | 40 |
| 3704 | ඩීසල් | 12 |
| | Engine Oil | 01 |

8.21 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2012 දෙසැම්බර් මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15474.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3579 | ඩීසල් | 46 |
| 3592 | ඩීසල් | 39 |
| 3709 | ඩීසල් | 42 |
| | Air Freshner | කැට 01 යි |

8:22 2012 නොවැම්බර් මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම්

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 23453 II | 9,335.98 |
| 34453 II | 1,105.44 |
| 52453 II | 42,589.30 |
| 62453 II | 15,125.52 |
| | 68,156.24 |

ජල බිල්පත් සඳහා රු. **68,156.24** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:23 2012 නොවැම්බර් මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 52454 | 16,931.80 |
| 52453 I | 30,365.27 |
| 62453 I | 15,761.89 |
| 34453 I | 4,599.38 |
| 23453 I | 1,890.01 |
| 11453 I | 42,361.79 |
| | 111,910.14 |

විදුලි බිල්පත් සඳහා රු: **112,954.94** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:24 2012 නොවැම්බර් මාසයට අදාල දුරකතන බිල්පත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11452 | 22,429.83 |
| 12452 | 1,163.28 |
| 25451 II | 2,671.49 |
| 62452 | 1,163. 28 |
| | 27,427.93 |

දුරකතන බිල්පත සඳහා රු: **27,427.93** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8.25 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සඳහා ලබා ගත් පුවත්පත් වෙනුවෙන් රු. 38745.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.26 2012 ඔක්තෝම්බර්, නොවැම්බර්, දෙසැම්බර් මාස 03 සඳහා මුද්දර බදු වශයෙන් රු. 10008.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.27 2012- IV කාර්තුව වෙනුවෙන් ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රු. 17734.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 2012- IV කාර්තුව වෙනුවෙන් VAT මුදල් ආපසු ගෙවීම් රු. 177658.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 2013 වර්ෂයේ තක්සේරු දැන්වීම් බෙදීම වෙනුවෙන් එම්. නලින් චන්ද්‍රජිත් මහතාට රු. 21610.00 ක් ලේකම්ගේ හා නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 භාවිතා නොකරන ලද පුටු වෙනුවෙන් රු. 1750.00 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි එල්. බී. ජිනපාල ද සිල්වා මහතා වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 පුස්තකාලය සඳහා ලබා ගත් අධිනීතිඥ බුද්ධික කුරුකුලරත්න මහතාගේ කෘතීන් 02 ක පිටපත් 14 ක් වෙනුවෙන් රු. 11550 ක් ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 පොල්වත්ත පුංචි පාලම අසළින් ඇති නුගේතුඩුව පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 98000.00 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය, සභාපති වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 පොල්වත්ත පුංචි පාලම අසළින් ඇති නුගේතුඩුව පාර ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ (අතිරේක වැඩ) රැඳවුම් මුදල වන රු. 9510.73 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය, සභාපති වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 හෙප්පුමුල්ල, සුමනමැදුර මාවත ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 98000.00 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල, ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.35 සිරි නිකේතාරාම පාර ඉතිරි කොටස තාර දැමීම කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 359440.77 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල, ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 හෙප්පුමුල්ල නානළිඳ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ අවසාන ගෙවීම වන රු. 61021.60 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි හෙප්පුමුල්ල, ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.37 252-0730 දරණ කැබ් රථයේ වායු සමීකරණ පද්ධතිය නිසි ආකාරයෙන් ක්‍රියා කරන බැවින් රු. 64000.00 මුදලින් 10% ක් රඳවා තබා ගෙන ඉතිරි මුදල ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි නාඔටුන්න ඔටෝ ඇන්ඩ් පවර් ඉංජිනියර්ස් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.38 ඕකන්ද පුස්තකාලට ඉහලින් යන මාර්ගයේ ඇති විදුලි කණුව ඉවත් කිරීම සඳහා රු. 33107.50 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි සී/ ස ලංකා විදුලි පුද්ගලික සමාගම වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.39 ගලි බවුසරය සඳහා 2006 වර්ෂයේ සිට ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මුදල වන රු. 39100.00 ක මුදල සහ දඩ මුදල වන රු. 10670.00 ක මුදල ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී. දඩ මුදල සම්බන්ධයෙන් අදාල නිලධාරියා වග කිව යුතු බවත් සභාව දන්වා සිටින ලදී.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඇයි මේක මෙච්චර කල් කරල නැත්තෙ. මේ දඩ මුදල සම්බන්ධයෙන් මන්ත්‍රීවරුන්ට වග කියන්න බැහැ. ඒක අදාල නිලධාරියාගෙන් අය කර ගන්න ඕනෙ. ලේකම් මහතා මේ දඩ මුදල අදාල නිලධාරියාගෙන් අය කර ගැනීම පිළිබඳ තීන්දුවක් ගන්න.

8.40 කෙරමිණිය පෙර පාසල සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 98000.00 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි බටපොල, ඉලුක්පිටිය, බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.41 පෝරඹ දේවාල පාර කාණුපද්ධතිය සහ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල වන රු. 88002.84 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි ඕකන්ද ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.42 කෙරමිණිය පුස්තකාලය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ (අමතර වැඩ) අවසාන ගෙවීම වන රු. 99607.48 ක් ලේකම්ගේ හා වැඩ අධිකාරීගේ නිර්දේශය පරිදි බටපොල බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2012 දෙසැම්බර් මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2012 දෙසැම්බර් මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** හිරේවත්ත ප්‍රජාශාලාව අමතර වැඩ සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 5000.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** පෝරඹ දේවාල පාර හරස් මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 511430.70 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** පින්නදූව එල්. සී. ද සිල්වා මාවත අංක 51/1 අසල පැති බැම්ම ඉදි කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 313961.51 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය ඉදිකිරීම 1 වන අදියර සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 2052571.40 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** තල්ගස්ගොඩ ක්‍රීඩාපිටිය ඉදිකිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 23470015.80 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

## (11) වෙනත් කරුණු

## (12) න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු

**12:1** **‘** ඔ/ අංක G/010/CT/15238 දරණ මුදල් ආරක්‍ෂණ ඔප්පුවේ කාලය දීර්ඝ කිරීම**’** මැයෙන් පොත් තබන නිලධාරිනිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ඉහත ඔප්පුවේ කාලය 2012/12/10 දිනෙන් අවසන් වන බවත් එය 2013 වර්ෂයට අලුත් කිරීම සඳහා රු. 38018.31 ක මුදලක් ශ්‍රී ලංකා රක්‍ෂණ සමාගමට ගෙවීමට අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඔ/ අංක G/010/CT/15238 දරණ මුදල් ආරක්‍ෂණ ඔප්පුවේ කාලය දීර්ඝ කිරීම සඳහා සභාවේ අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ‘ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ තරගය - 2012 ’ මැයෙන් වැඩ සංවර්ධන සහකාර මිය විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

පහත සඳහන් යෝජනා අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බවත දන්වා තිබුණි.

1. කසළ මාර්ගයට බැහැර කිරීමට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කිරීම

2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවක් පිහිටුවීම

3. කසළ ප්‍රතිචක්‍රීකරණය සම්බන්ධ වාර්ෂික සැළැස්ම සකස් කිරීම

4. මහා පරිමාණ හෝටල් සහ ව්‍යාපාරික ස්ථාන වලින් බැහැර කරනු ලබන කසළ වෙනුවෙන් මුදල් අය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීම

5. ගෘහස්ථ කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන නිවෙස්වලින් බැහැර කරනු ලබන දිරාපත්වන කසළ දිනපතා එකතු කිරීම වෙනුවට සතියකට දෙවරක් වන ලෙසට එකතු කිරීමේ කටයුතු සිදු කිරීමට හා දිරාපත් නොවන කසළ සති දෙකකට වරක් එකතු කිරිමේ කටයුතු සිදු කිරිමේ වැඩ පිළිවෙලක් සකස් කිරීම

6. ගෘහස්ථ කසළ කළමනාකරණ කටයුතු නිසියාකාරව සිදු වන්නේද යන්න පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදු කිරීමට හා කසළ වෙන් කිරීම හා ප්‍රතිචක්‍රීකරණ කටයුතු සඳහා යොමු කිරීම ආදිය පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කිරීම. එස ඳහා නගර සභා නිලධාරියෙකු යෙදවීම.

7. නගරය ආශ්‍රිතව කසළ බඳුන් තැබීම නිසා නගරයේ අලංකාරයට හානි පැමිණෙන බැවින් නගරයේ කසළ බඳුන් තැබීමෙන් වැළකීමට ක්‍රියාකිරීම සුදුසු බව.

8. ප්‍රජාව විසින් නගරයේ පවතින හිස් බිම් කසළ දැමීමට භාවිත කිරීමට පුරුදු වී ඇති බැවින් එවැනි කුඩා බිම් ප්‍රමාණ හෝ ප්‍රයෝජනවත් කටයුත්තක් සඳහා යෙදවීම සුදුසු බව හා නගරයේ අලංකාරය එමගින් ඇති වන බව.

9. සෞඛ්‍ය කම්කරුවන් සඳහා නිල ඇඳුමක් ලබා දීම, අත්වැසුම් හා පාවහන් ලබා දීම, මාස 03 ට වරක් හෝ වෛද්‍ය පරීක්ෂණ සඳහා ඉදිරිපත් කිරීම.

තීරණය

☞ **ඉහත සඳහන් සියලු කාරණා සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:3** ‘ තණකොළ කපන යන්ත්‍රය අලුත් වැඩියා කිරීම සම්බන්ධවයි ’ මැයෙන් වැඩ පරිපාලක මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

තණකොල කපන යන්ත්‍රය දැනට භාවිතා කල නොහැකි මට්ටමක පවතින බවත් එය අලුත්වැඩියා කිරීම සඳහා මිලට ගත් ආයතනයෙන් විමසනු ලදුව රු. 36181.34 ක ඇස්තමේන්තුවක් ලබා දී ඇති බවත් එම ආයතනය මගින් මෙය අලුත්වැඩියා කර ගැනීමට අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ඊට වඩා හොඳයි කරේ එල්ලන් යන එකක් ගත්තනම්.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මේක ලක්‍ෂ දෙක හමාරක් විතර වෙන යන්ත්‍රයක්. එක නිසා හැදුවට කමක් නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මම සති දෙක තුනකට කලින් ඉල්ලීමක් කරා මානාන පිට්ටනියෙ තණකොල කපන්න කියලා. අද වෙනතුරු කිසිම ප්‍රතිචාරයක් දක්වල නැහැ. ඔය පිට්ටනිය සවුත්තු වුනේ ඇල්ටන් මහත්තය හින්ද. ඊයෙ පෙරේද පස් කියුබ් තුනක් මම ගෙනල්ල දැම්ම.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මෙතන කපල ඉවරවුනහම ඒ පිට්ටනියෙ කපන්න.

තීරණය

☞ **තණකොල කපන යන්ත්‍රය අලුත්වැඩියා කිරීම සඳහා එය මිලදී ගත් ආයතනයට රු. 36181.34 ක මුදලක් ගෙවා එම කාර්ය ඉටුකර ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** ‘ අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රීඩා උළෙල- 2013 ’ මැයෙන් අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අන්තර් ක්‍රීඩා සමාජ තරග පැවැත්වීම සඳහා 2013 මාර්තු 03 දින පොල්වත්ත ක්‍රීඩාංගණය සහ නගරසභා ක්‍රීඩාංගණය වෙන් කරවා ගත් බවත් නමුත් එදිනට වෙනත් අයෙකු විසින් නගරසභා ක්‍රීඩාංගණය ක්‍රීඩාංගණය වෙන් කර ගත් බව

දැනගන්නට ලැබනු බවත් එමනිසා එදිනට පොල්වත්ත ක්‍රීඩාංගණය සහ 2013-02-24, 04, 25 සහ මාර්තු 03 දිනයන්ටද පොල්වත්ත ක්‍රිඩාංගණය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

__තීරණය__

☞ **අන්තර ක්‍රීඩා සමාජ ක්‍රිඩා උළෙලේ තරග පැවැත්වීම සඳහා 2013 පෙබරවාරි 04,24,25 යන දිනයන්ද මාර්තු 03 දිනයද මුදල් අය කිරීමකින් තොරව පොල්වත්ත පියසේන ක්‍රීඩාංගණය ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** **‘** සරප් කවුන්ටරය මධ්‍යාහ්න 12.00 ත් ප. ව. 1.15 ත් අතර විවෘතව තැබීම ’ මැයෙන් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

2013-01-08 මාසික සභාවේ ගරු උප සභාපතිතුමා විසින් සරප් කවුන්ටරය මධ්‍යාහ්න 12.00 ත් ප. ව. 1.15 ත් අතර කාලය තුලද විවෘතව තබන ලෙස ඉල්ලා සිටි නමුත් ලේකම්තුමා සහ ගණකාධිකාරී තුමා විසින් එය සිදු කිරීම අපහසු බවත් දන්වා තිබුණි.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,__

සභාපතිතුමනි මම ඉල්ලා සිටියේ මේ අම්බලන්ගොඩ වැසියන්ට සිදුවන අපහසුතාවය සඳහා ඒ පැය ඇතුලත කවුරුහරි යොදවන්න කියලා. අක්‍රමිකතා සිදුවන ඒව වලක්වන්න තමයි නිලධාරින් ඉන්නෙ. මේ නිලධාරීන්ට රජයෙන් වැටුපක් දෙන්නෙ මහජනතාවට සේවය කරනන්න. ඒ නිසා මම ඉල්ලා සිටිනව මේ ඉල්ලීම නැවත සලකා බලල ඉටු කරන ලෙස. ඉතා පලපුරුදු ගණකාධිකාරී වරයෙක් අපේ ඉන්නෙ. මම හිතනවා මෙය කරන්න පුලුවන් කියලා.

__ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,__

සභාපතිතුමනි මේක බරපතල කාරණයක්. වෙන කෙනෙක් මේක භාර ගන්න කැමති වෙන එකක් නැහැ. මම දන්නව කැෂයර් තමයි සල්ලි ගෙනියන්නෙ බැංකුවට. ඉස්සර වාහන තිබුනෙ නෑ. 83 දි මම නගර සභාවට එනකොට වාහනයක් නෑ. එතුමා යන්නෙ පයින්. මේ මුදල් සම්බන්ධ වගකීම දෙන්නෙකුට දුන්නෑ. අද වාහනයක් තියෙනවා. ඒක ඇතුලෙන් හරි දෙන්න ක්‍රමයක් හදන්න ඕනෙ. අපි මේකෙදි දෙපැත්තම බලන්න ඕනෙ. මෙතනදි කෙරිය යුත්තෙ පැය බාගයක් කෑමට දීල පැය බාගයක් ඇති බැංකුවට ගිහිල්ල එන්න. පැයෙන් අරින්න කියන්න.

__ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,__

සභාපතිතුමනි මිනිස්සු සල්ලි දීල යන්න එන්නෙ මෙතෙන්ට. 12.05 ට ආවත් ඒ පුද්ගලයා ඉන්න ඕනෙ 1. 15 වෙනකම්ම.

__ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,__

බැංකුවට සල්ලි දාන්න කැෂියර් නැතුව වෙන කෙනෙක් යවන්න බැරිද? මන්ත්‍රිවරුන්ගෙ අදහස් අනුව පැය එකයි කාලක් වහන්නෙ නැතුව කාලය අඩු කර ගන්න ක්‍රමවේදයක් යොදා ගන්න. නිලධාරින් කතා කරල සභාවට යෝජනාවක් දෙන්න. අපි ඒක අනුමත කරන්නම්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි  බැංකුවත් එක්ක කතා කර ගන්න නගර සභාවෙන් ආවම රස්තියාදු කරන්නෙ නැතුව ඇතුලෙන් ගන්න කියලා ඉන්න වෙන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි  සල්ලි 12 ට ගෙනියන්නෙ නැතුව 3 ට ගෙනියන්න පුලුවන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ගණකාධිකාරීතුමා බැංකුවත් එක්ක කතා කරල හවසට සල්ලි ගෙනියන ක්‍රමයක් හදන්න. මේක රජයේ ආයතනයක්නෙ. කැෂියරට 3.30 ට යන්න කියන්න. කෑමට පැය බාගෙ විතරක් වහන්න.

**<u>තීරණය</u>**

☞ **මහජනතාවගේ පහසුව උදෙසා සරප් කවුන්ටරය දිවා විවේකය සඳහා පැය 1/2 ක කාලයක් පමණක් වසා තැබීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:6** ‘ ස්තුතිය පල කිරීම ’ මැයෙන් අම්බලන්ගොඩ දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලයේ සංගීත අංශයේ දරු දැරියන් සමස්ථ ලංකා තරග සඳහා ඉදිරිපත්වී ජයග්‍රහණ ලබා ගත් බවත් ඒ සඳහා පුහුණු වීම් සිදු කරන්නට නොමිලයේ නගර ශාලාව ලබා දීම වෙනුවෙන් ස්තුතිය පුද කරන බවත් දන්වා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:7** ‘ බුද්ධදත්ත මාවත II වන පටුමග කාණු පද්ධතිය ඉදිකිරීම සම්බන්ධවයි’ මැයෙන් වැඩ අධිකාරීතුමා විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

ඉහත කර්මාන්තය සෘජු ශ්‍රමික පදනම මත ඉටු කර බවත් එහි ඇස්තමේන්තු වටිනාකම රු. 248977/- ක් බවත් කර්මාන්තයේ  ඇස්තමේන්තු වටිනාකම රු. 455113.43 ක් බවත් දන්වා තිබුණි.

**<u>තීරණය</u>**

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:8** ‘ ධීවර සංකීර්ණ ශාලාව සඳහා ප්ලාස්ටික් පුටු 300 ක් ලබා ගැනීම ’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

ක්‍රීඩා කමිටුවේදී ගත් තීරණයක් අනුව ක්‍රීඩා මණ්ඩපය සඳහා පුටු අවශ්‍ය බැවින් ඒ සඳහා ධීවර සංකීර්ණ ශාලාවේ ඇති පුටු 240 ලබා ගැනම සුදුසු බවත් ධීවර සංකීර්ණය සඳහා අලුතින් ප්ලාස්ටික් පුටු 300 ක් ලබා ගැනීම යෝග්‍ය බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි එතන දවල් කාලෙට සවස් කාලෙට හරිම අපහසුයි ඉන්න. ස්ටේජ් එකේ ඉන්නම බැහැ. පෝරණුවෙ දැම්ම වගේ. ඒනිසා වාතාශ්‍රය ලැබෙන පරිදි මොනව හරි කරනව නම් හොඳයි. පැයක් එතන ඉන්න කොට යන්න හිතෙනවා. අපි මුදල් අය කරල මේක දෙන්නෙ. ඒ නිසා සුදුසු පියවරක් ගන්න කියල මම ඉල්ලීමක් කරනවා. ඒවගේම පිරිසිදු කිරීම ඉතාම දුර්වලයි. මකුණු දැල් බැඳිල. ඒවගේ පාලනයක් නෑ. දුවිලි බැඳිල ඉතාම අවලස්සන විදියටයි තියෙන්නෙ. ඒ දිහාත් ටිකක් බලන්න. ඒවගේම නගර ශාලාව ඇතුලත් පිරිසිදු කරන්න. මකුණු දැල් බැඳිල තියෙන්නෙ. අපේ රැස්වීමකදි කොළඹින් ආපු අයත් මට කිව්ව මේක ඇයි මෙහෙම තියෙන්නෙ කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරි මහතා ඒක බලන්න. ඇස්තමේන්තුවක් අවශ්‍ය නම් දෙන්න. ධීවර සංකීර්ණයේ රස්සෙ වැඩි එකට මොකක් හරි ක්‍රමයක් බලමු. ටේබල් ටෙනිස් වලට දාපු ඒවත් තාම තියෙනව. ඒව ටිකත් අයින් කරල දාන්න.

<u>තීරණය</u>

☞ **ධීවර සංකීර්ණයේ ඇති පුටු 240 ක්‍රීඩා මණ්ඩපය සඳහා ලබා දීමටත් ධීවර සංකීර්ණය සඳහා අලුතින් ප්ලාස්ටික් පුටු 300 ක් මිලදී ගැනීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**ප. ව. 1.45 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා සභා ගර්භයෙන් පිටව යන ලදී.**

**12:9** ‘ 2012-12-31 දිනට ගබඩා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ’ සභාගත කරන ලදී.

| ද්‍රව්‍යයෙහි නම | පොත අනුව ශේෂය | ණන් ගත් පරිදි ශේෂය | වැඩිපුර තිබූ ශේෂය | අඩුවෙන් තිබූ බඩු |
|---|---|---|---|---|
| ආයුර්වේද ද්‍රව්‍ය | 4217.50 | - | - | 4217.50 |
| විදුලි භාණ්ඩ | 414090.13 | 413542.63 | - | 547.50 |
| ලිපිද්‍රව්‍ය | 566341.66 | 566341.66 | - | - |
| සාමාන්‍යගබඩා භාණ්ඩ | 1295362.07 | 1283446.48 | - | 11915.59 |
| | 2280011.36 | 2263330.77 | | 16680.59 |

ගබඩා ලෙජරය අනුව ශේෂය 2280011.36

ගබඩාවේ ශේෂය 2263330.77

2012. 12. 04 දින මාසික සභාවේ අංක 3:6 පරිදි 2012. 12. 31 දිනට පැවැත්වූ ගබඩා භාණ්ඩ සමීක්ෂණයේ දී අනාවරණය වූ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන්, තීරණ ගැනීම සඳහා ඉදිරිපත් කරන්නෙමු.

01. ගබඩාවට භාර දෙන ලද පාවිච්චි කළ නොහැකි භාණ්ඩ ගබඩාවේ රැඳී තිබීම නිසා ඉඩ ඇහිරී ඇත. එම භාණ්ඩ පොදු 47 ආකෘති පත්‍රයෙන් සටහන් කර ඉදිරිපත් කරමු. එම භාණ්ඩ වෙන්දේසි කිරීමටත්, වෙන්දේසි නොවන භාණ්ඩ විනාශ කිරීමටත්, නිර්දේශ කරන්නෙමු.

02. වර්ෂ 2000 ට පෙර ගබඩා භාරකරු ලෙස රාජකාරී කර ස්ථාන මාරු වී ගිය බී. ජී. බන්දුල මහතාගෙන් ඇතිවූ ඌණතාවය සම්බන්ධයෙන් මීට පෙර එම මහතාට සහ ඔහු සේවය කරන, ගාල්ල මහ නගර සභාවේ කොමසාරිස්තුමාට ද, පළාත් පාලන කොමසාරිස්තුමාට ද දන්වා ඇත. මෙතෙක් එම ඌණතාවය නිරාකරණය වී නොමැති බැවින්, ඒ සම්බන්ධයෙන් සභාවේ තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමු.

03. ගබඩාවේ ඇති මිනුම් උපකරණ කට්ටලය ගබඩාව තුල තිබීමෙන් දිරාපත් වන බැවින් කර්මාන්ත අංශයේ අදාල නිලධාරීන් හට භාර දීමට කටයුතු කළ යුතු බව දන්වා සිටිමු.

04. ගබඩාවේ වහල අලුත්වැඩියා කරන ලෙස ගබඩා භාර නිලධාරිනිය විසින් ඉල්ලීමක් කරන ලද බැවින්, ඒ සඳහා සුදුසු කටයුතු කරන මෙන් දන්වා සිටිමු.

05. මීට පෙර වර්ෂ වල ගබඩා භාණ්ඩ සමීක්ෂණය කිරීමේ දී ගබඩා භාණ්ඩ තැන්පත් කර තිබූ ආකාරය සලකා බැලීමේ දී, මේ වර්ෂයේ ගබඩා භාණ්ඩ අංක යොදා වර්ග කර තිබීම හේතුවෙන් පහසුවෙන් ගබඩා සමීක්ෂණ කටයුතු නිම කිරීමට හැකි වූ බව සඳහන් කරන්නෙමු.

<u>තීරණය</u>

☞ **ගබඩා සමීක්ෂණ වාර්තාවේ වෙන්දේසි කිරීමට සහ විනාශ කිරීමට ඉදිරිපත් කර ඇති භාණ්ඩ වෙන්දේසි කිරීම හා විනාශ කිරීමටත්, බී. ජී. බන්දුල මහතාගෙන් මුදල අය කර ගැනීමට පළාත් පාලන කොමසාරිස් තුමා වෙත ලිපියක් යොමු කිරීමටත්, මිනුම් කට්ටලය ගබඩාවේම තැබීමටත්, වහල අලුත්වැඩියාව සඳහා ඇස්තමේන්තුවක් ඉදිරිපත් කිරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:10** ' 2012-12-31 දිනට ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ' සභාගත කරන ලදී.

මෙම නිලධාරීන් හා සේවකයන් දැනට සේවයේ යෙදී සිටින බැවින් සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ භාණ්ඩ පිළිබඳ විමසීමක් කර පිලිගත හැකි හේතූන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් වටිනාකම අයකර ගැනීම නිර්දේශ කරන්නෙමු.

**<u>තීරණය</u>**

☞ **දැනට සේවයේ යෙදී සිටින නිලධාරීන්ගෙන් සමීක්ෂණයට ඉදිරිපත් කිරීමට නොහැකි වූ භාණ්ඩ පිළිබඳ විමසීමක් කර පිලිගත හැකි හේතූන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් වටිනාකම අය කර ගැනීමටත්, ආයතනයේ දැනට නොමැති ස්ථාන මාරු වී ගිය ඇති සහ විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් පිලිගත හැකි හේතු ඉදිරිපත් නොකරන්නේ නම් වටිනාකම අය කර ගැනීමටත්, තල්ගස්ගොඩ පෙර පාසල සඳහා පරිත්‍යාග වශයෙන් ලැබී ඇති භාණ්ඩද තක්සේරුකර ඉන්වෙන්ට්‍රිගත කිරීමටද, පොල්වත්ත පෙර පාසල් සංකීර්ණයේ ඇති ඉහත අංක 3 සහ භාණ්ඩ ඉන්වෙන්ට්‍රිගත කිරීමටද, පාවිච්චි කල නොහැකි භාණ්ඩ විනාශ කිරීමට සහ බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කිරීමටත්, ගංවතුරෙන් විනාශ වූ භාණ්ඩ ඉවත් කිරීමටත් වෙනත් කරුණු යටතේ දක්වා ඇති නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහාත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:11** **‘** 2012-12-31 දිනට පුස්තකාල පොත් සමීක්ෂණ වාර්තාව **’** සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගර සභාවේ 2012/12/04 දින පැවැත්වූ මහ සභාවේ තීරන අංක 3 : 6 අනුව නගර සභා ප්‍රධාන පුස්තකාලයේ හා ශාඛා පුස්තකාලවල 2012/12/31 දින දක්වා පුස්තකාල පොත් පිළිබඳ සිදුකරන ලද සමීක්ෂණ අනුව සමීක්ෂණ වාර්ථාව පහත සදහන් කරන්නෙමු.

**01. පොත් පිළිබඳ සමීක්ෂණ වාර්ථාව**

| උංකය | පුස්තකාලයේ නම | මුළු පොත් සංඛ්‍යාව | විනාශ කිරීමට නිර්දේශ පොත් | ඉදිරිපත් නොවූ පොත් | 2012/12/31 දිනට පොත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රධාන පුස්තකාලය | 17385 | 32 | 14 | 17339 |
| 02 | මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය | 3599 | 71 | 07 | 3521 |
| 03 | ඕකන්ද ශාඛා පුස්තකාලය | 1483 | - | 03 | 1480 |
| 04 | පෝරඹ ශාඛා පුස්තකාලය | 2673 | 02 | - | 2671 |
| 05 | පොල්වත්ත ශාඛා | 2251 | 03 | 03 | 2245 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පුස්තකාලය | | | | |
| 06 | හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලය | 1239 | - | 01 | 1238 |
| 07 | හිරේවත්ත ශාඛා පුස්තකාලය | 1580 | - | - | 1580 |
| 08 | කෙරමිණිය ශාඛා පුස්තකාලය | 1473 | - | 04 | 1469 |
| | එකතුව | 31683 | 108 | 32 | 31543 |

## 02. ඉදිරිපත් නොකරන ලද පොත් පිළිබඳ වාර්තාව (ඇමුණුම 01)

| අංකය | පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව | වටිනාකම රු. | 25% දෙපාර්තමේන්තු ගාස්තු රු. | මුළු මුදල රු. |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රධාන පුස්තකාලය | 14 | 2321.00 | 580.25 | 2901.25 |
| 02 | මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය | 07 | 370.50 | 92.62 | 463.12 |
| 03 | ඕකන්ද ශාඛා පුස්තකාලය | 03 | 24.50 | 6.87 | 31.37 |
| 04 | පොල්වත්ත ශාඛා පුස්තකාලය | 03 | 287.50 | 71.87 | 359.37 |
| 05 | හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලය | 01 | - | - | - |
| 06 | කෙරමිණිය ශාඛා පුස්තකාලය | 04 | 250.00 | 62.50 | 312.50 |
| | එකතුව | 32 | 3253.50 | 814.11 | 4067.61 |

03. විනාශ කිරීමට තිරණය කරන ලද පොත් පිළිබද වාර්ථාව. ( ඇමුණුම 02)

| අංකය | පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රධාන පුස්තකාලය | 32 |
| 02 | මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය | 71 |
| 03 | පෝරඹ ශාඛා පුස්තකාලය | 02 |
| 04 | පොල්වත්ත ශාඛා පුස්තකාලය | 03 |

04. බැදීමට ඇති පොත් පිළිබද වාර්ථාව. ( ඇමුණුම 03 )

i) කෙරමිණිය ශාඛා පුස්තකාලය - පොත් 12

05. නිර්දේශ

i) මෙම වාර්ථාවේ සදහන් පරිහරනය කිරීමට නොහැකි තත්වයේ ඇති පොත් විනාශ කිරීමටත් එම පොත්වල වටිනාකම ලේඛනයෙන් ඉවත් කිරීමටත්, ( ඇමුණුම 02 )

ii) ඉදිරිපත් නොවු පොත්වල වටිනාකම අදාල සේවකයන්ගෙන් අයකර ගැනීමටත්, ( ඇමුණුම 01 )

iii) බැදීමට නිර්දේශ කරඇති පොත් පුස්තකාලයේ පොත් බැදුම්කරු ලවා බැන්දවීමටත්,( ඇමුණුම 03 )

iv) ප්‍රධාන පුස්තකාලයේ දැනට පොත් තබා ඇති රාක්ක ප්‍රමානවත් නොවේ. 2012 වර්ෂයේ අලුත් පොත් මිලදී ගෙන ඇති බැවින් එම පොත් තබා ගැනිමට රාක්ක ඉඩ නොමැත. එමනිසා අලුත් පොත් රාක්ක 05 ක පමණ ලබාදීම සුදුසු වේ.

v) මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයට පොත්වල ආරක්ෂාව සදහා පොත් අල්මාරි 02 ක් පළමු අධියර වශයෙන් ලබාදීමටත්,

vi) පොල්වත්ත ශාඛා පුස්තකාලයේ වසර 10 කටත් වඩා පැරණි සාමාජිකයන් සොයා ගැනීමට නොහැකි කාඩ්පත් 06 ක පොත් ලේඛනයෙන් කපාහැරීමට සුදුසු වේ. ( ඇමුණුම 04 )

මේ අනුව ඉහත නිර්දේශයන් අනුමැතිය සදහා ඉදිරිපත් කරමි.

ඉදිරිපත් කිරීමට නොහැකි වු පොත් (ඇමුණුම 01)

**ප්‍රධාන පුස්තකාලය**

01. 1644 Exploring our country 5.00
02. 3922 The code of life 3.00
03. 4007 Anti duhrird 3.00
04. 18889 Elenent of modern 30.00
05 . 18980 භීෂණයේ අතුරු කතාවක් 300.00
06. 19417 පේජ් මේකර් 190.00
07. 19583 ජ්‍යොතිෂ්‍ය ඉගනීම 300.00
08. 19920 කළමනාකරන ක්‍රමවේදය 375.00
09. 20333 Deriâtives and equty -
10. 21568 අසම්පත ලදෙක් ඇය 300.00
11. 22458 The fire eaters -
12. 22528 Calling the shorts -
13. 23350 ධවල හංස 6 340.00
14. 23616 රසායන විද්‍යාව 745.00

**පොල්වත්ත ශාඛා පුස්තකාලය**

01. 685 සද්ධර්ම රත්නාවලිය සංග්‍රහය 27.50
02. 749 ඉලෙක්ට්‍රොනික විද්‍යා මූලධර්ම 180.00
03. 1420 විද්‍යාව හා තාක්ෂණවේදය 80.00

**ඕකන්ද ශාඛා පුස්තකාලය**

01 214 ඔබේ කේන්ද්‍රයේ හත 27.50
02 280 t ha adventurous three -
03 1184 over tha mountain -

**හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලය**

01 840 දූෂනය පලවා හරිමු -

**කෙරමිණිය ශාඛා පුස්තකාලය**

01 769 සුන්දර ගල්මල් සුරකිමු -
02 878 , 10-11 ශ්‍රේණි සිංහල ප්‍රායෝගික ලේඛන 125.00
03 880 සිරිලක දියඇලි 125.00
04 1183 The Ranaways -

**මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාල**

01 85 පොළවෙන් විශ්වයට 3.50

| | | | |
|---|---|---|---|
| 02 | 146 | Moddie question papers | 20.00 |
| 03 | 152 | Introdution to life skills | 10.00 |
| 04 | 185 | දෙදෙනාම දියණියෝ | 12.00 |
| 05 | 981 | සිහිනි කතන්දර | 10.00 |
| 06 | 1605 | රන් තලයේ නිධානය | - |
| 07 | 3298 | ශක්ති විද්‍යාව-තාප රසායනය | 300.00 |

**බැදීම සඳහා ඉදිරිපත් කරඇති පොත් (ඇමුණුම 03)**

**කෙරමිණිය ශාඛා පුස්තකාලය**

01) 447 සහෝදරයෝ

02) 484 පවනක් වී එන්නම්

03) 500 තනිතරුව

04) 548 චාතුර්‍යා 1

05) 593 අපේ ගම

06) 651 ලංකා භූගෝල විද්‍යාව

07) 653 සඳහිරු දා වත

08) 664 හිරුට අයිති ලොව

09) 703 පුංචි කුමාරිකාවක්

10) 707 සෙනුරි 02

11) 708 ගැහැණු ළමයි

12) 980 රසායන විද්‍යාව 1-11 (උ:පෙ:)

**භාවිතයෙන් ඉවත් කිරීමට නිර්දේශිත පොත් (ඇමුණුම 02)**

**ප්‍රධාන පුස්තකාලය-** <u>(විමර්ශන අංශය)</u>

01. 14 ඓතිහාසික ලේඛන

02. 5281 ජ්‍යාමිතික යාන්ත්‍රික ඇඳිම

03. 6334 සිතියම් හා රේඛා සටහන්

04. 7120 භෞතික භූගෝල විද්‍යාව

05. 13383 ගණිතය අ:පො:ස:

06. 15178 මූලධර්ම

07. 15209 නව මූලික ආර්ථික විද්‍යාව

<u>(ළමා අංශය)</u>

01. 1933 Mind pies and

02.13681 පන බේරාගත් හැටි

03. 16590 රන් මාලාව

04. 17280 ඔ ත්තුව

05 . 17967 පාට හරිත

06. 18189 කාලකන්නි පුත්‍ර කුමරා

07. 18401 මොණර මංගලයය
08. 20442 මකුළු මිනිසා
09. 22383 මාස්ටරගයිඩ් ශිෂ්‍යත්ව හුරුව
10. 23718 නැට්ටුක්කාරි

(බැහැර දෙන අංශය)
01. 1364 මහා පරිනිර්මාන ධර්මය
02. 4291 උ:පෙ: ව්‍යවහාරික ගණිතය
03. 4539 ළිහිණි පොත්
04. 14448 සුළිය
05. 14467 සදට මුවාවී
06. 15547 Death merchant
07. 15666 පිං ළමයා
08. 16680 පිය දරය
09. 17466 Plane trigonometry
10. 5875 Tennis
11. 9080 සංඛ්‍යානය
12. 16321 පරවියන් ඇවිල්ලා
13. 16616 ටොව් සෝයර්
14. 18116 ජන්මයෙන් ජන්මයට
15. 20749 දයාබර ටොමී

**පෝරඹ පුස්තකාලය**
01. 138 ඝනසංගවස්ථූපකරණය
02. 528 විශ්ව පාඨමාලාව 1 ලේඛනය

**පොල්වත්ත පුස්තකාලය**
01. 145 දැණුමෙන් රුදාව
02. 1514 පහ ශ්‍රේණි ශිෂ්‍යාධාර
03. 1649 පදහැර නැගීම

**මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලය**
01. 17 පේමතෝ ජායතෝ සෝකෝ
02. 44 ඩොල්පින් දූපත
03. 69 ලස්සන ඉංග්‍රීසි ගුරුවරයා
04. 124 උදාර පුද්ගලයෝ
05. 160 කඩුපුල්
06. 190 කරතොට නාහිමි.
07. 196 ගුණදාස නැවතිලා
08. 199 , 1948 සිංහලේ නිදහස් සටන
09. 201 සාහිත්‍ය තිළිණ

10. 242 කළා හතර

11. 246 වන දරුවෝ

12. 251 රජරට පොත

13. 252 රජරට පොත

14. 253 පද්‍යාවලී

15. 270 ලංක ාමාතා

16. 283 පාළි සංදේශාවලී

17. 289 ජනකවි

18. 299 ලංකා කතා

19. 304 ප්‍රාදේශිය භූගෝල විද්‍යාව (ආසියාව)

20. 315 ඓතිහාසික ජනකතා

21. 324 විලම්බීත

22. 328 සාරාක්ෂි සංග්‍රහය

23. 332 වල්මත්වී හසරක් නුදුට්මි.

24. 339 සිංහල අකුරු

25. 348 භෞතික විද්‍යාව

26. 364 සීහල වත්ථුපතරණය

27. 369 සිංහල මහිමය

28. 375. සංශිප්ත ලංකා ඉතිහාසය

29. 381 ගී සංකේත

30. 383 The wonder world of science

31. 457 Pianning for plenty

32. 544 නවීන පද්‍ය රචනා

33. 615 Devid copperfield

34. 632 Pianoforte examiítion pieeeces 1987

35. 635 Pitman shorthand new course

36. 727 පුංචි රතු හැට්ටකාරී හා අයියයි නංගියි

37. 729 Gulliv's trvels

38. 743 චින්ගීස් ආයිත්මානව් කෙටි නව කතා

39. 759 කපිතාන්ගේ දියණියෝ

40. 883 0ntarro old upper canadu

41.918 බෞද්ධ ශිෂ්ටාචාරය

42. 975 අනගාරික ධර්මපාල තුමා

43. 1019 අ:පො:ස: (උ:පෙ:) රසායන විද්‍යාව

44. 1024 Ambush on sataì hill

45. 1026 Hahg the cow boy high

46. 1027 Epitaph for a marhal

47. 1032 The saibt cleans up

48. 1035 Welis fargo agnt

49. 1044 Neo-clonialism and global strategy

50. 1048 Towards communism alongthe Leninist road

51. 1051 South of rio grande

52. 1152 හංස සංදේශය

53. 1153 නව කවි සරණිය නිබන්ධන

54. 1215. ව්‍යාපාරික ගණිතය සම්ති විද්‍යාව හා දුවසම්ති විද්‍යාව

55. 1258 වැටත් නියරත් ගොයම් කානම්

56. 1364 සංඛ්‍යා වේගය

57. 1452 පහළ ඌවේ ජනකවි

58. 1460 දුටු ගැමුණු මහ රජතුමා

59. 1460 සියනෑ ලේඛකයෝ

60. 1494 Practcing maths

61. 1619 සංගීතාංජලී ශාස්ත්‍රිය සංග්‍රහය

62. 1648 පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ජ භූගෝල විද්‍යාව 2

63. 1738 සවිස්තර සිංහල ව්‍යාකරණය

64. 1763 සීනි කාපු හැටි

65. 1932 වන උයනක සිරි විමන

66. 1950 The radiant way fourth step

67. 2020 කඩදාසි බබා

68. 2022 කූබි බබා

69. 2044 සුපු නව යෞවන නව කතාව දිරිය දරුවන්ට

70. 2088 කේජු කිඹුලා

71. 2940 Overseas

**පොල්වත්ත ශාඛා පුස්තකාලය භාරනුදුන් පොත්- (සාමාජිකයන් හදුනා ගත නොහැකි )**-(ඇමුණුම 04)

| සාමාජික අංකය | පාඨකයාගේ නම | පොතේ නම |
|---|---|---|
| 78 | නදිෂා කුමුදුමලී<br>33, නුගේතුඩුව පාර<br>පොල්වත්ත | 1305 පීජ් වෑන් වින්ගල් සහ වෙනත් කතා |
| 22 | දිලංක සුජිත් ශානක<br>3/ඒ. නුගේතුඩුව පාර<br>පොල්වත්ත | 331 මුහුදු පත්ලේ මාවත<br>1229 නරලොව හොල්මන් |
| 14 | ජයන්ත පියසුන්දර<br>04,පඤ්ඤාලෝක මාවත<br>පොල්වත්ත | 770 බටහිර සංගීතය |

| | | |
|---|---|---|
| 95 | කාහිංගල ශදීෂ<br>අසිදු හංසික<br>8/10,බුද්ධ දත්ත මාවත<br>පොල්වත්ත | 433 ඊසොප්ගේ නවක උපමා කතා<br>941 කොරල් දූපත |

2008 වර්ෂයේ සිට සමීක්ෂණයට ඇතුලත් වී නොමැත

<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි රාක්ක වලට මෙහේ තියෙන ලී වලින් කරන්න පුලුවන්නෙ.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාවේ සඳහන් පරිහරණය කිරීමට නොහැකි පොත් විනාශ කිරීමටත් පොත්වල වටිනාකම ලේඛනයෙන් ඉවත් කිරීමටත්, ඉදිරිපත් නොවූ පොත් වල වටිනාකම අදාල සේවකයන්ගෙන් අය කර ගැනීමටත්, බැඳීමට නිර්දේශිත පොත් පුස්තකාලයේ පොත් බැඳුම්කරු ලවා බැඳීමටත්, ප්‍රධාන පුස්තකාලයේ ඇති පොත් තබා ඇති රාක්ක ප්‍රමාණවත් නොවන බැවින් ද 2012 අලුතින් පොත් මිලදී ගෙන ඇති බැවින් ද එම පොත් තැබීමට රාක්ක ඉඩ නොමැති බැවින් ද අලුත් රාක්ක 5 ක් ලබා දීමටත්, මහ අම්බලන්ගොඩ පුස්තකාලය සඳහා පොත් අල්මාරි දෙකක් ලබා දීමටත්, පොල්වත්ත ශාඛා පුස්තකාලයේ වසර 10 කට වඩා පැරණි සාමාජිකයන් සොයා ගැනීමට නොහැකි කාඩ්පත් 6 ක් පොත් ලේඛනයෙන් කපා හැරීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ‘ රැකියා සම්මුඛ පරීක්ෂණ වැඩ සටහන සඳහා ධීවර සංකීර්ණ ගොඩනැගිල්ල වෙන් කරවා ගැනීම ’ මැයෙන් ප්‍රාදේශිය ලේකම්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ශ්‍රී ලංකා රැකියා බැංකුව මගින් ක්‍රියාත්මක කරනු ලබන රැකියා ලබා දීමේ ව්‍යාපෘතියේ සම්මුඛ පරීක්ෂණය සඳහා ධීවර සංකීර්ණ ශාලාව 2013-02-13 දින මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **රැකියා සම්මුඛ පරීක්ෂණ වැඩ සටහන සඳහා 2013-02-13 දින ධීවර සංකීර්ණ ශාලාව මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:13** ‘ ක්‍රීඩා පිටිය වෙන්කිරීම සම්බන්ධවයි ’ මැයෙන් ධර්මාශෝක විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලයේ සියවස් සැමරුම වෙනුවෙන් පවත්වන ක්‍රීඩා සැණකෙලියේ එක් අංගයක් සඳහා 2013-02-25 පොහොය දින ක්‍රීඩා පිටිය අවශ්‍ය බවත් ඒ සඳහා අවසරය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

පෝය දිනවලට ප්‍රදේශයේ නායක ස්වාමීන් වහන්සේලාගේ ඉල්ලීමක් පරිදි ක්‍රීඩා පිටිය අපි ලබා දුන්නෙ නැහැ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි එදාට තියෙන වැඩසටහන ලොකුවට සද්ද කරන එකක් නෙමෙයි.

<u>තීරණය</u>

☞ **සියවස් සැමරීම විශේෂ වැඩසටහනක් බැවින් 2013-02-25 පෝය දින ක්‍රීඩා පිටිය ලබා දීමටත් ඉදිරියේදී පෝය දිනයන්හි වෙන් කිරීම් කිරීමේදී අනිවාර්යෙන්ම සභා අනුමැතියක් ලබා ගත යුතු බවටත් සභාව තීරණය කරන ලදී.**

**12:14** ‘ 2013 ජනවාරි මස වාර්තාව ’ මැයෙන් ආයුර්වේද වෛද්‍ය නිලධාරීතුමිය විසින් ඉදිරිපත් කර තිබු ලිපිය සභාගත කරන ලදී.

ආයතනය විවෘතව තැබූ දින ගණන 19 ක් බවත් පැමිණි රෝගීන් සංඛ්‍යාව 284 ක් බවත් ඖෂධ සඳහා වැයවූ මුදල රු. 19669.73 ක් බවත් එක් රෝගියෙක් සඳහා වැයවූ මුදල රු. 69.00 ක් බවත් සඳහන් කර තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම වාර්තාව සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:15** ‘ අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා වූ ශ්‍රමදාන වැඩසටහන ජනවාරි - මාර්තු 2013 ’ මැයෙන් සංවර්ධන සහකාර මිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

නගර සභා බල ප්‍රදේශය තුල ඩෙංගු මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා ශ්‍රමදාන වැඩසටහනක් ක්‍රායාත්මක කිරීමට සැලසුම් කර ඇති බවත් එහිදී ශ්‍රමදානයට පෙර දින ශබ්ද විකාශන යන්ත්‍ර මගින් ජනතාව දැනුවත් කිරීම, ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම, කාණු පවිත්‍ර කිරීම, කැඩීබිඳී ඇති වැසිකිළි වළවල් පිළිසකර කිරීම, මාර්ග දෙපස එළි පෙහෙලි කිරීම, මදුරුවන් බෝවිය හැකි ස්ථාන හඳුනා ගෙන ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම, අවශ්‍ය ස්ථානවල ධූමායන කටයුතු සිදු කිරීම සඳහාත් අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා ඉදිරිපත් කර ඇති කාර්යන් වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:16** ' අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා වූ ශ්‍රමදාන වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් ඇස්තමේන්තුව ' මැයෙන් සංවර්ධන සහකාර මිය විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

ශ්‍රමදාන වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් ඇස්තමේන්තුව රු. 61425.00 ක් බවත් ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **ඩෙංගු රෝගය වැළැක්වීම සඳහා වූ ශ්‍රමදාන වැඩසටහන වෙනුවෙන් රු. 61425.00 ක ඇස්තමේන්තුව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:17** ' අම්බලන්ගොඩ නගර සභා සීමාව තුල වූ නගර සභාව මගින් භුක්ති විඳීමක් සිදු නොකරන දේපල හා බැදේ. ' මැයෙන් ජේ. එල්. මහින්දසිරි ප්‍රනාන්දු මහතා විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

දැනට නගර සභා කොට්ඨාශ අංක 11 කෙරම්ණිය ප්‍රදේශයේ පිහිටා ඇති තල්ගහ වත්ත නොහොත් තල්ගස්ගොඩ වත්ත අක්කර 16 ක් පමණ විශාල ප්‍රදේශය, තෙපුල් රාජපක්ෂ මහතාගේ නිවස සහ කේ. කුලසේන ද සිල්වා මහතාගේ නිවෙස් දෙක මැද පිහිටි නිවස සහ ඉඩමද, විහාරගොඩ බැද්ද නැමති අක්කර 10 කට වඩා විශාල ඉඩමද නගර සභාවට අයත් කොටස් ඇති බැවින් මේ පිළිබඳව අධ්‍යයනයක් සිදු කර නගර සභා සීමාවට එකතු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>ගරු නගර සභා මන්ත්‍රී ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි අපේ හිටපු මන්ත්‍රී මහින්දසිරි ප්‍රනාන්දු මහතා විසින් ඉදිරිපත් කරල තියෙනව අපේ බල ප්‍රදේශයට අයත් විය යුතු භූමි ප්‍රමාණයන් පිළිබඳව. මීට පෙරත් මේ සම්බන්ධයෙන් අපි ඔබතුමාටත් ප්‍රධාන අමාත්‍යතුමාටත් කරුණු ඉදිරිපත් කරා. ඔබතුමාලගේ උපදෙස් පරිදි එහිදී සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවට ඉල්ලීමක් කරා. ඒවගේම මේ යෝජනාවත් සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවට යොමු කිරීම උචිත වෙනවා. ඒවගේම කෙරම්ණිය තල්ගහවත්ත ඉඩම් කොටස බලපිටිය ප්‍රාදේශීය සභාවෙ 1 වන කොට්ඨාශය ලෙස තිබිල තියෙනවා. ඒවගේම එතුමා අංක 3 යටතේ විස්තර කරපු කොටස නමුත් අපටම අයත් කියල සාක්ෂියක් නැහැ. අක්කර දෙකක වගේ ප්‍රමාණයක් අපිට වරිපනම් ගෙවනවා. වැඩි හරියක් ගෙවන්නෙ බලපිටියට. වැඩි භූමි ප්‍රමාණයක් අපිට ලබා ගැනීමට මේ අවස්ථාව සුදුසු නිසා එතුමන්ගෙ අදහස් ටික සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාව වෙත සභාව හරහා යැවීම සුදුසුයි කියල අපි ප්‍රකාශ කරනවා. ඒවගේම එතුමාට ස්තුති කර ලිපියක් යවන්න කියලත් ඉල්ලා සිටිනවා.

<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>

සභාපතිතුමනි මගේ ගෙදර තියෙන හරියෙ තියෙනව ඉඩමක් වටේම ඒව අයිති අම්බලන්ගොඩ නගර සභාවට. මැද කොටස අයිති ප්‍රාදේශීය සභාවට. මේ ඉඩම වටේම ඒව නගර සභාවට අයිති. මේක හරි ගැටළුවක්. අපි මේක කමිටුවටත් දාල තියෙන්නේ. මේකට විදුලිය දෙන්න ගියහම ඒඅ ය කියනව අපි සභාවෙන් කියල මෙක නවත්තගෙන ඉන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්ලිව්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මටත් ලිපියෙ පිටපතක් එවල තිබුණා. ඒ මහත්මය ප්‍රදේශයෙ අයත් එක්ක වතුගෙදර සුළු නගර සභවට තිබුණ කොටස නගර සභාවට ගැනීම සඳහා පින්නදුව , කෙරම්ණය ප්‍රදේශවල අය එක්ක එකතු වෙලා ලොකු සටනක් කරල තමයි අපි ඒක ලබා ගත්තෙ. තල්ගස්ගොඩත් අහුවුනා ඒ කොටසට. නමුත් ඒ මහතා පළමුවෙන්ම මන්ත්‍රීවරය වෙලා ආපු වෙලාවෙත් ඒ මහත්මය සටන් කරා කොට්ඨාශ අංක 1 ට අහුවෙන කෑල්ල තමයි මේ අත ඇරිල තියෙන්නෙ. මේක අපි ඉල්ලුවට ප්‍රාදේශීය සභාවෙන් දෙන්නෑ. මම ඉල්ලා සිටිනවා කොයි එකටත් මේක සීමා නිර්ණය කිරීමේ කොමිටියට ඉදිරිපත් කරන්න කියල සභාවෙ අනුමත කල යෝජනාවක් විදියට.

**ප. ව. 2.00 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා මුලාසනයෙන් ඉවත්ව ගිය බැවින් ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා මුලාසනයේ අසුන් ගන්නා ලදී.**

**ප. ව. 2.00 ට පමණ ගරු නගර සභා මන්ත්‍රී කේ. එම්. චන්ද්‍රසිරි මහතා සභා ගර්භයෙන් පිටව යන ලදී.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි සීමා නිර්ණයේදී පෞද්ගලිකව අපට අදහස් ඉදිරිපත් කරන්න කියල ඉල්ලීම් කරල තියෙනවා. අපි එක්සත් ජාතික පක්ෂ කණ්ඩායම විදියට රැස්වෙලා ඒ තීරණ අරගෙන තීරණ ඇරියා. දැන් තමුන්නාන්සේලා කියනවා අපි මේව ඉදිරිපත් කරල තියෙනවා කියලා. අපි දැනගන්න කැමතියි මොන ආකාරයෙන්ද ඒ විදියට යෝජනා ඉදිරිපත් කරෙ කියන එක. කොට්ඨාශ කීයකට කැඩෙනවද 12 ද 13 ද? 12 හැටියට සලකල අපි ප්‍රපෝසල් එකක් ඇරියා. තමුන්නාන්සේලත් ඒ විදියට ඇරියද කියල මම දැනගන්න කැමතියි.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

අපි සාකච්ඡා කරපු විදියට නම් කොට්ඨාශ 13 යි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

එතකොට මහාවීදිය කොට්ඨාශෙ නැති වෙනවා. ග්‍රාමසේවා වසම් වෙනකොට මහා වීදියක් නැති වෙනවනෙ. පටබැඳි මුල්ල කොටසකුයි හිරේවත්ත කොටසකුයි එකතු කරල මහා වීදිය හැදිල තියෙන්නෙ.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

දැනට ක්‍රියාත්මක වන ග්‍රාමසේවක කොට්ඨාශ අනුව තමයි කොට්ඨාශ නිර්ණය කරන්න කිව්වෙ.

<u>තීරණය</u>

**ඉහත ලිපියේ සඳහන් කරුණු සභාවේ යෝජනාවක් ලෙස සීමා නිර්ණය කිරීමේ කොමිසම වෙත යොමු කිරීමට සභාව තීරණය කරන ලදී.**

## වෙනත් කරුණු

**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**

සභාපතිතුමනි, හිරේවත්තෙ තියෙනව ජල සම්පත් මණ්ඩලය මගින් අම්බලන්ගොඩට ජලය ලබා දීපු වෙලාවෙ තියපු සමරු ඵලකය. මට කීප දෙනෙක් කිව්ව මේක ගැලවීම හරිද කියලා. මේක ගැලවීම බරපතල වැරැද්දක්. ඒවගේ දේවල් ගලවන කොට නැවත ස්ථාපිත කරන්න ඕනෙ. ඒක නිවැරදි කරන්න කියල ඉල්ලා සිටිනවා. 1980 ගණන් වල ප්‍රේමදාස මහත්මය ඇවිල්ල රයිටර් තිලකසේකර මහත්මයගෙ මන්ත්‍රී ධුරය තිබුන කාලෙ. මමත් නගර සභාවෙ හිටිය.

**ගරු සභාපති කමල් වැල්ලගේ  මහතා කථා කරමින්,**

මේ දිනවල එතන අළුත්වැඩියා කටයුතු කරනවා. වැඩ අධිකාරී තුමා මේ ගැන බලන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේවි රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයේ වැසිකිළිය හා ඇඳුම් මාරු කරන ස්ථානය අබලන් තත්වෙට පත්වෙලා තියෙන්නෙ. පුහුණුවන ළමයෙකුගෙ ඇගට එහෙම වැටුනොත් ලොකු ඛේදවාචකයක් වෙන්න පුළුවන්. අඩියක විතර ප්‍රමාණයක් දුරස් වෙලා තියෙන්නෙ. හැකි ඉක්මනින් මේක පිළිසකර කරන්න කියල ඉල්ලා සිටිනවා. යම් දෙයක් වුනොත් ඒකෙ වගකීම අපිට භාරගන්න වෙනවා.

**ගරු සභාපති කමල් වැල්ලගේ  මහතා කථා කරමින්,**

එහි තිබෙන අනතුරුදායක තත්වය තුරන් කරන්න කටයුතු කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි බරපතල ප්‍රශ්නයක් තියෙනවා. මාර්ගවල වාහන තදබදය නිසා පදිකයන්ට ගමන් කිරීමේ අපහසුවක් තියෙනවා. අතුරු මාර්ගවල පවා. පදිකයන්ට කාණුවටම යන්න සිදු වෙනවා. පදිකයන්ට යන්තම් හරි පාරෙ ඉතුරු වෙලා තියෙන ඉඩ ප්‍රමාණය තාර කට්ටත් කාණුවත් අතර. ඒ ප්‍රමාණෙ සියළුම පාරවල් වල කැළෑ වැවිල තියෙන්නෙ. ඒනිසා පදිකයො එතෙන්ට අඩිය තියන්න බයයි. ඒ බිම් තීරුව වත් සයිඩ් ගහල පිරිසිදු කරල දෙන්න.

අනිත් එක ස්ටේෂන් හංදියේ බිල්ඩින් එක පින්තාරු කරන්න කියල කීප වතාවක්ම කිව්ව. තාම කෙරිල නැහැ. පින්තාරු කරන්නෙ නැත්නම් සුද්ද කරලවත් දාන්න.

**ගරු සභාපති කමල් වැල්ලගේ  මහතා කථා කරමින්,**

වැඩ අධිකාරීතුමා ඒක ඉක්මනින් කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි තව පොඩි කාරණාවක් තියෙනව. බස් නැවතුම්පොලේ උඩ පුටු දාල තියෙන ස්ථානයේ පාසල් ළමුන් පාසල් ඇරිල කෑම කනවා. පුටු උඩ තියාගෙන තමයි බත් පැකට් එක කන්නෙ. එතෙන්ට පුළුවන්නම් මේසයක් දෙකක් දැම්මොත් පොදු සේවයක් වේවි.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

එතන ඒ වෙලාවට විතරයි ඔය ප්‍රශ්නෙ තියෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

දැම්මයි කියල අගතියක් වෙන්නෙත් නැනෙ. ළමයෙකුට පොතක් බලන්න උනත් පුළුවන්නෙ.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

අනිත් වෙලාවට වෙන දේවල් කරනවනෙ එපාර. පොඩි වෙලාවකට විතරයි ප්‍රයෝජනවත් වෙන්නෙ. ඔබතුමා මුලින් කියපු කාරනේ දි අපේ පාරවල් වලට වඩා දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පාරවල් වල තමයි වැඩිපුරම තියෙන්නෙ. ඒ අයට දන්වල යවන්න මේ පාරවල් පිරිසිදු කිරීම් කරන්න කියල.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මී හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,</u>**

සභාපතිතුමනි පසුගිය දිනක අනවසර වෙළදාම් කරපු අය අල්ලල පොලිසිය මගින් අධිකරණයට ඉදිරිපත් කරල තිබුණා. මහේස්ත්‍රාත්තුමා පොලිසියට හරියට දොස් කිව්ව. බලනකොට අත් අඩංගුවට අරන් තිබුණෙ කෙසෙල් ඇරියක්, කොටින් බඩ් පැකට් එකක් වගේ දෙයක්. නගර සභාවෙ නිලධාරීනුත් ඒ අවස්ථාවෙ අපහසුතාවයට පත්වුනාද දන්නෙ නැහැ. අත්අඩංගුවට ගන්නව නම් සියළුදේම ගන්න කියන්න. මම එතන හිටිය නිසා දන්නව මහේස්ත්‍රාත්තුමා නගර සබාවටත් දොස් කිව්ව. මම කියන්නෙ එහෙම නොවෙන්න වගබලා ගන්න කියන එකයි.

**<u>ගරු සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,</u>**

නිලධාරීන් දැනගන්න ඕනෙ කෙසෙල් කැන් ලොරියක් තිබුන නම් ලොරියම අරන් යන්න. ලොරිය ඇරල කෙසෙල් ඇවරියක් අරගෙන ගියහම ගැටළුවක්. නගර සභාවට දොස් කියන්නෙ අපේ නිලධාරීන් පොලිසියත් එක්ක යන්නෙ. එහිදී වෙච්ච අඩුපාඩුවක් නිසා තමයි දෝෂාරෝපණය කරන්නෙ.

අපි හැමදාම නිලධාරීන්ට කියනව මේක අධීක්ෂණය කරන්න කියලා. මෙහිදී මම කියන්න ඕනෙ ගරු සභාපතිතුමාට එක් පුද්ගලයෙක් මෙතෙන්ට ඇවිල්ල දෝෂාරෝපණය කරා. අම්බලන්ගොඩයි කියල පාරෙ වෙළදාම් කරන්නට බැනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේක දිගින් දිගටම ප්‍රශ්නයක් ආකාරයට යනව නෙමෙයි. ගියවර සභාවෙ අපේ ගරු සරත් ශ්‍රීලාල් මන්ත්‍රීතුමා ඉල්ලීමක් කරා පොත් බෙදාදීම සම්බන්ධයෙන් ලැයිස්තු ඉදිරිපත් කරන්න කියලා. අපේ අනන්‍යතාවය තහවුරු කර ගන්න. නමුත් ඒ දේ සිද්ධ වුනේ නැහැ. අනිත් කරුණ පුංචි පොල සම්බන්ධව කඩ ඉවත් කරන්න කියල නියෝගයක් කරා. ඒ සම්බන්ධව පසු විපරම් තත්වය කොහොමද? එදිනෙන් පස්සෙත් මම ඇප්ලිකේෂන් ලබා දුන්නයි කියලත් කිව්ව. ඒ පස්සෙ දීපුවට මෙතෙක් පොත් ලැබිල නැහැ.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි දින වකවානු ඇයි අවශ්‍ය වෙන්නෙ. ඇප්ලිකේෂන් 2000 ක් බෙදුව නම් ඒ 2000 ට පොත් ගෙනිල්ල තියෙනවනෙ. කවද දුන්නත් ඒව දෙන්න ඕනෙ. අපි අහන්නෙ මන්ත්‍රීවරු 12 දෙනාට වෙන වෙනම බෙදපු ලැයිස්තු දෙන්න. මම ඒකයි ගෙවීම අනුමත කරන්න ඡන්දය නොදුන්නෙ.

ප. ව. 2.25 ට පමණ ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා නැවත මූලාසනයේ අසුන් ගන්නා ලදී.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පුංචි පොල සම්බන්ධව වැඩ අධිකාරීතුමා ඒ දේවල් ක්‍රියාත්මක කරල තියෙනවයි කිව්ව.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඒ සම්බන්ධයෙන් අනවසර වාර්තාව යවල තියෙනවා. මෙතෙක් කල් නාගරික සංවර්ධන අධිකාරියෙන් තමයි නඩු පැවරීම කලේ. ඒ අය දන්වල තියෙනව නඩු පැවරීමේ බලතල නගර සභාවට පැවරුවයි කියලා. ඒ ලිපිය ලැබුන ගමන් නඩු පවරනව. අපි පුංචි පොල සම්බන්ධයෙන් දරන ස්ථාවරය වන්නෙ නිසි සැළැස්මක් සහිතව හරි විදියට දැම්මොත් අපි අනුමත කරනව.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මාළු වෙළඳ පොල සම්බන්ධව අපිරිසිදු තත්වයක් තියෙන්නෙ.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

පී. එච්. අයි. මහතා ඒව බලල සුද්ද කරන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ග්‍රේෂන් කෙරම්ණියගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි පොඩි ඉල්ලීමක් තියෙනවා එස්. එම්. නිහාල් එරික් මහතා කෙරම්ණියෙ ඔබතුමාට මතකයි අපේ මුනින්ද්‍රදාස මහත්මා පදිංචිව සිටි පාර පුළුල් කිරීමේදී නිහාල් එරික් මහතාට ප්‍රවේශ මාර්ගය හැටියට හීනටිය පාර තිබියදී ඔහු තමන්ගෙ ඉඩමෙන් අඩි 2 ක ප්‍රමාණයක් දුන්න පාර පුළුල් කරන්න. ඔහු ඉල්ලීමක් කරනව වැසි ජලය බැහැර කිරීම සඳහා කොන්ක්‍රීටු කරන ලද ඒ මාර්ගයේ කානු පද්ධතියක් සකස් කරල දෙන්න කියලා. එහෙම නැත්තම් ඒ මාර්ගයේම වලක් කපා ගන්න ඉඩ දෙන්න කියලා.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

ඔතන වල තියෙද්දිනෙ කොන්ක්‍රීට් කරේ. ගොඩක් අය පාරට දුන්නනෙ. තිබුන වලම හදාගන්න කියන්න.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. පී. ලක්ෂ්මි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,**

සභාපතිතුමනි මම කලිනුත් කිව්ව. හීගල්දුවෙ පාර හදද්දි අපට රාමචන්ද්‍ර මහත්මියගෙ ගෙදරින් කැමැත්තෙන්ම දුන්න. ඒකට අත්තිවාරම දාල දුන්නොත් හොඳයි. වත්ත හෝදන් යනව කියල මට කිව්ව.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

අපට මුද්දර ගාස්තු එන්න තියෙනවා පළාත් සභාවෙන් ලක්ෂ 100 ක් විතර. ඒ ආවොත අපට ඔය වැඩ ඔක්කොම කරන්න පුළුවන්.

**ප. ව. 02.35 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

ඩී. වී. සුනිල්,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 02 – 27 දින,**
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**